# මාලදිවයින්

සේනානායක මුදියන්සේ

"ස්පාඤ්ඤය මලක්කාවට යවපු ඔත්තුකාරයෙක් පසුව මාලදිවයිනට ගිහින් එහි ගැහැණියකුට එක් වෙලා බීන්න බැස්සා. ඔහු මහමදාගම වැළඳගෙන අබ්දුල්ලා ෂාවි කියන නම ගත්තා. ස්පාඤ්ඤයට ආ විටක රාජ්‍ය නිලධාරියෙක් සමඟ කථාවේ වැටුනු අබ්දුල්ලා, "මාලදිවයින මහමදික රටක් වුනාට ඉස්සර බුදුන්ගේ රටක්. රටවැසියන්ට කිව්වේ දිවෙහි සිංහලයෝ කියලයි; සිංහලයෝ මාළු ඇල්ලුවේ නෑ; ගොවිතැන් කළා; රෙදි වියුව; ........................................ දිවෙහි රටට බාබේරි හමුදාවක් කඩා පැනල මහරජිණ අල්ලලා මැරුව; බුදුන්ගේ ධර්මය උගන්නපු භික්ෂු භික්ෂුණීන් වහන්සේලා සේරම අල්ලලා මුතුවෙරු දූපතට ගෙනිහින් මැරුවා; කාපේරි වහලුන් යොදවල සංඝාරාම එක්දහස් පන්සියය ම බින්දෙව්වා; දිවෙහි සිංහලයෝ හරි ලස්සන කථා දනගෙන ඉඳල තියෙනවා." කියමින් මාලේ ජනකථා කිහිපයක් කිව්වා. නිලධාරියා අබ්දුල්ලා ගැන කාලෝස් රජ්ජුරුවන්ට දැන්වුවා. රජතුමා සියලුම කථන්දර ලියා රාජ්‍ය ලේඛනාගාරයේ තැන්පත් කරන්නැයි නියම කළා. අබ්දුල්ලා තුන් මාසයක් තිස්සේ කී කථා සංඛ්‍යාව ගණනින් දෙසීයකට වැඩියි."

යුරෝපයේ ලේඛනාගාර හා පුස්තකාලවල සඟවා ඇති ආසියාවේ පැරණි ලේඛන හා පොත් පත් මෙන්ම ආසියාව ගැන ලියවුනු ලේඛන ද ඇසුරු කරමින් සේනානායක මහතා මෙම කුඩා ග්‍රන්ථයෙන් හෙළිදරව් කරන්නේ මාලදිවයින පිළිබඳ ඉතිහාසය පමණක් නොවේ. සිංහලයාගේ ඉතිහාසය පිළිබඳව ද බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳව ද අගනා කරුණු සම්භාරයක් මින් හෙළිදරව් කෙරේ.

ISBN955-9170-03-1

**සී/ස (පෞද්) විසිදුනු ප්‍රකාශකයෝ**
448, වැව පාර, බොරලැස්ගමුව.
දුරකථන: 518682

මිල රු. 45/-

කවර නිර්මාණය : කේ. ඩබ්ලිව්. ජනරංජන

# මාලදිවයින්

සේනානායක මුදියන්සේ



මාල දිවයින්

© සේනානායක මුදියන්සේ

ප්‍රථම මුද්‍රණය : 1996 පෙබරවාරි

ISBN 955 - 9170 - 03 - 1

මුද්‍රණය සහ ප්‍රකාශනය :
සීමාසහිත (පෞද්ගලික) විසිදුනු ප්‍රකාශකයෝ
448, වැව පාර, බොරලැස්ගමුව.

දුර ඇමතුම : 518682

Ashoka wanted to enlighten the world not through violence and destruction but through righteousness in thought, speech and action.

Not a single drop of blood was shed in connection with his Mission. In contrast to Churchianity and the so called Islam he did not send out missionaries with a book in one hand and sword in the other, killing, lying and stealing and singing and shouting "hallelujah, praise the lord" and "allahu akbar".

– JOHAN FORSSTROM
(THE KING of the JEWS)

# සුරඹ වල්ලි

මාලු පිනි නැතිනම් ව්‍යංජන සමඟ බත් කෑ සිංහලයින් බොහොම ආදි කාලයේ සිට ව්‍යංජන රසවත් කිරීමට උම්බලකඩ භාවිතා කළා. ඉස්සර පටන්ම ලංකාවට උම්බලකඩ ගෙනාවේ මාලදිවයින්වලිනුයි. තිරිඟු පිටි නිපද වූ බටහිර සමාගම්වලට සිංහලයින්ගෙ ආහාර රුචිය වෙනස් කරන්ඩ අවශ්‍ය වුණා. ඔවුන්ට හසු වූ ආණ්ඩුව 1972 අවුරුද්දේ දී විදේශ විනිමය පාලන නීති යොදල උම්බලකඩ ආනයනය ඇහිරුව. බත් කෑ රට වැසියන් බොහෝ දෙනා මේ තහංචියට කැමැත්තක් දක්වූයේ නෑ.

මාලදිවයින් ලෝක සිතියමේ දක්වෙන්නෙ තිත් ඛිහිපයකිනුයි. එබඳු රටක් ඇති බව යුරෝපීන් අහන්නෙ සංචාරක සමාගමක වෙළඳ දැන්වීමකින්. ඉදහිට සිංහල පත්තරයක මාලදිවයින් ඇහලුම් කම්හලක සේවිකාවන් සඳහා ඇබෑර්තු දැන්වීමක් හෝ මාලදිවයිනේ ජුකී මහන්ඩ ගෙනිහින් අතරමං කළ සිංහල කාන්තාවන් පිරිසක් පිළිබඳ ප්‍රවෘත්තියක් දකින්ඩ හැකියි.

මෑතක් වෙනකන්ම මාලදිවයින් වාසීන් ඔවුන්ගෙ රටට දිවෙහි රාජ්ජෙ කිව්ව. දිවෙහි රාජ්ජෙ වාසීන් දිවෙහින්. ඔවුන්ගෙ භාෂාව දිවෙහි. දිවෙහි භාෂාව සිංහල භාෂාවට ඉතා සමාන බව භාෂාවේදීන් පෙන්වනව. ඇතැම් වියතුන් කියන විදිහට දිවෙහි භාෂාව එළු සිංහල-යයි. ලංකාව ත්‍රි සිංහලය නමින් හැඳින් වූ කාලයක් තිබුණා. ත්‍රි සිංහලයේ සිංහල භාෂා තුනක් භාවිතා කළා. දිවෙහි ව්‍යවහාර භාෂාව විතරක් නෙමේ කාලයක දී ලිඛිත භාෂාව සහ ඉලක්කම් ද සිංහලයට සමාන වුණා.

දිවෙහි රාජ්ජේ කිව්වෙ දූපත් එකතුකර ගොඩනැංවූ රාජ්ජෙ යන අර්ථයෙනුයි. ඉස්සර දූපත්හි යක්ෂ හා නාග රාජධානි කීපයක් තිබී තියෙනව. දූපත් කීපයක ලංකාවෙ වැද්දන්ට සමාන වනවාසී ගෝත්‍රයක් ද හිටිය. ගිරවර ජනයා කියන්නෙ ඔවුන්ගෙන් පැවතෙන්නන්ටයි.

ලංකාවට වාගේම දිවෙහි රාජ්ජෙටත් දඹදිව සිට ආර්යයන් පැමිණියා. ලංකාවෙ වංශ කථා පරිදි සිංහපුරයෙ සිංහබාහු රජ්ජුරුවන්ගෙ පුතා විජය පිරිවර කණ්ඩායමකුත් හදගෙන රටවාසීන්ට හිරිහැර වෙන විදිහට හැසිරුන නිසා විජය සහ පිරිවර කණ්ඩායම මරා දමන්නැයි රටවාසීන් රජ්ජුරුවන්ට කිව්ව. රජ්ජුරුවො විජය හා පිරිවර අත් අඩංගුවට ගෙන ඔවුන්ගේ දිගු කෙස්මුඩු ගසා නැව් නංවා රටින් පිටුවහල් කළා. ඒ සමග ඔවුන්ගේ දරුවන් හා භාර්යාවන් ද වෙන වෙනම නැව් නංවා පිට කළා. විජය හා පිරිවර ලංකාදීපයට ගොඩ බැස්ස. මහිලාවන් ගොඩ බැස්ස රට මහිලා දිවයින් නම් වුණා. දරුවන් යැවුනෙ නග්න දිවයින්වලටයි.

මාල දිවයිනේ ජන කථාවක් විදිහට පියා මැරු සිංහ රාජ්ජෙ නපුරු රජ්ජුරුවන්ට විරුද්ධව ඔහුගේ පුතා විජය කැරලි ගැහුව. යක්ෂ ගෝත්‍රිකයින් විජයට උදව් කළා. රජ්ජුරුවො විජය හා ඔහුගේ ආධාරකරුවන් අල්ලා රටින් පිටුවහල් කළා. විජයගේ බිසව සුරඹ වල්ලි දේවිය ප්‍රමුඛ යක් ස්ත්‍රීන් හා ඔවුන් ගේ දූ දරුවන් ද වෙන වෙනම නැව්වලට දමා පිට කළා. විජය රුගත් නැව යකුන්ගේ රට ලංකා පුරයට ගියා. කුණාටුවකට හසු වූ අනිත් නැව් මුහුදේ ගසාගෙන ගොහින් සුරඹ වල්ලි රුගත් නැව කිඳුරු දූවට සේන්දු වුණා. දරුවන් රුගත් නැව පැමිණියේ නාගයින් වාසය කළ මැණික් දූවටයි.

මාලදිවයින් ඉන්දියානු සාගරයේ පිහිටි දූපත් පෙලක්. භූ විද්‍යාඥයින් පෙන්නා දෙන විදිහට අවුරුදු කෝටි ගණනකට පෙර පොළවෙන් මතු වූ ගිණි කන්දක්



නිවෙන්ඩ පටන් ගත්ත. එය අන්තිමට නිවී ක්ෂය වී මුහුදේ ගිලී ගියා. මුහුද මතුපිට ඉතිරි වූ හුණු ගල් තට්ටුව දූපත් පංතියක් බවට පත්වුණා. මාලදිවයින් කියන්නෙ ඒ දූපත් සමූහයටයි.

මාලදිවයින් ජන රජය හැදෙන්නෙ දූපත් 1195ක් එකතු වෙලා. දූපත් කීපයක් හැර ඉතිරි සේරම පිහිටා ඇත්තෙ පොකුරු වශයෙනුයි. හැම දූපත් පොකුරක්ම ඊට විශේෂ වූ හුණුගල් තට්ටුවකින් හා කොරල් කලාපයකින් සමන්විතයි. දූපත් මුහුදෙන් ආරක්ෂා කරන ස්වභාවික පවුර තමා කොරල් හා හුණුගල් තට්ටුව. මේ පවුර කෙරේ මාලදිවයින් පාලකයින් ව්‍යාපාරයකයින් හා වැසියන් කිසිම දයාවක් දක්වූයේ නැහැ. ඔවුන් කොරල් හා හුණුගල් කඩමින් පසුගිය කාලය තිස්සේම ගොඩනැගිලි මන්දිර හෝටල් ගුවන් තොටු ගෙවල් හා වෙනත් ගොඩනැගිලි ඉදි කළා. පාරවල් හැදුව. හුණුගල් කැඩූ නිසා දිවයින් මුහුදෙන් ආරක්ෂා කරන ස්වභාවික පවුර බිඳී ගියා. දැන් මුහුද බලවත්. ඉතාම කෙටි කාලයක දී මාලදිවයින් ගිල ගන්න මුහුද සූදනම් වෙනව.

රට බේරාගන්න විදිහක් නැති බව ජනාධිපති අබ්දුල් ගයුම් කිව්ව. හුණුගල් තිබූ මුහුදු බිමට කොන්ක්‍රීට් දමා කොරල් වැව්වොත් දූපත් ගණනාවක් බේරාගන්ඩ හැකියි විද්‍යාඥයා පෙන්නුව. එම නිසා එබඳු ව්‍යාපෘති පටන් ගත්ත. නමුත් කෘත්‍රිම බිමක කොරල් වැවීම විශාල වියදමක් දරා කළ යුතු වැඩක්. මාලදිවයින් ධනවත් රටක් නෙමේ.

ඉස්ලාම් රාජ්ජයක් වූ මාලදිවයින ජනගහණ වර්ධන වේගය අනුව ලෝකයේ හත්වැනි තැන ලබා ගෙන ඉන්නව. මිරිදිය මාලදිවයින්වලට හිඟ වස්තුවක්. වැඩි ජනගහණයට ඔවුන් වැඩියෙන් මිරිදිය ලබාගත යුත්තෙ පොළව යටිනුයි. භූගත ජලය අසීමිත ලෙස උඩට අදිද්දි භූතලයේ වෙනස්කම් ඇති වෙනව. දෙවනුව වැඩි

වැඩියෙන් ගොඩනැගිලි හැදෙද්දී දූපත් මතු පිටට බර වැඩිවෙනවා. අපද්‍රව්‍ය තමා දැසින් දැකිමට පුළුවන් විපත. කුණු දැම්මටම දූපත් වෙන්කර ඇතත් ඉවත දමන කුණු-වලින් කොටසක් මුහුදට එක් වෙනව. ඒ කුණු විසින් කරන්නෙ කොරල් මරා මරා දැම්මයි.

මාලදිව් වාසීන්ගෙ ප්‍රධාන ජීවන මග මාලු කර්මාන්තය පරද සංචාරක ව්‍යාපාරය දියුණු කරන්ඩ පාලකයින් මහන්සි ගත්ත. තරු හෝටල් හා ගුවන් තොටු හැදුවෙ ඊටයි. වායු සමීකරණය කළ හෝටල්වල මිරිදිය නාන තටාක පවා තියෙනව. ඒවාට මිරිදිය හදන්නෙ කරදියෙන්. මේ අතර මහජන උවමනාව බව කියා දිවයිනක් ගානෙ විදුලිය බෙදනව. විදුලිය හා විදුලිය භාණ්ඩ වැඩියෙන් පාවිච්චි කරද්දී පරිසරය උණුසුම් වීම වැඩියි. පරිසරය සුළුවෙන් හෝ උණුසුම් වෙද්දී කොරල් මැරෙන්ඩ ගන්නව.

මාලදිවයින්වලට සංචාරකයින් එන්නෙ මුහුදට ආශාවෙනුයි. එන වැඩි දෙනා කිමිදෙනව. කිමිදෙන හැම අයෙකුගෙන් ම කොරල්වලට කුමන හෝ හානියක් සිදු වෙනව. ඔය අතර කොරල් කඩන්නොත් ඉන්නව. සංචාරක ව්‍යාපාරය කියන්නෙ බටහිර රටවල ඕනකමක්. යුරෝපයේ ඒකාධිකාරයක්. මෙම ව්‍යාපාරය මාලදිවයින්, ලංකාව ආදී රටවලට කොඩිවිනයක්. නමුත් බටහිර උපදෙස් සහ ආධාර හොයන පාලකයින්ට යුරෝපයට පිටුපාන්ඩ බැහැ. ඔවුන් හැම විටම යුරෝපය සතුටු කරන්ඩ වෙහෙසිය යුතුයි.

මිහිතලය විනාශ කළේ කාර්මික රටවල් විසිනුයි. ගුණධර්මවලින් අසංවර්ධිත ඔවුන්ගේ කාර්මිකකරණය, බලශක්ති නිපදවීම, න්‍යෂ්ටික පර්යේෂණ හා පරිසර විනාශකාරී වැඩ නිසා වායුගෝලයේ කාබන්ඩයොක්සයිඩ ප්‍රමාණය වැඩිවුණා. එවිට වායුගෝලයේ උෂ්නත්වය ඉහළ ගියා. වැඩි වූ උෂ්නත්වය විසින් ධ්‍රැව ප්‍රදේශවල



හිම කඳු පවා දිය කරන්ඩ ගත්ත. හිම කඳු දියවෙද්දී මුහුදේ ජල මට්ටම ඉහළ නගිනව. නුදුරු අනාගතයේ බංගාලි දේශයෙන් විශාල කොටසක් මුහුදට බිලිවෙනව. ශ්‍රී ලංකාවට මුහුදු තර්ජනයක් එනව. මාලදිවයින් සමූහය මුහුද ගිල ගන්නව.

ඒ අවස්ථාවේ දී මාලදිවයින් වාසීන් ලක්ෂ ගණනින් ලංකාවට ඒවි. ඔවුන් එවීමට දැන්ම තියා අර අදිනව. බලවතකුගේ ඉන්දීය සාගර කලාපය පිළිබඳ ලිපි ගොණුවක මෙසේ සඳහන්ව තියෙනව:

“එවිට මාලදිවයින් අනාථයින් යැවෙන්නේ…… …… හා ශ්‍රී ලංකාවටයි. සරණාගතයින් බාරගන්නැයි පවත්නා ඕනෑම ආණ්ඩුවකට බලකිරීමෙ හැකියාව ශ්‍රී ලංකාවේ ඉස්ලාමිකයින්ට ඇත. ඔවුන්ට ශ්‍රී ලංකාවේ කතෝලික සභාවේ හා අන් සියළුම ක්‍රිස්තියානි සභාවන්හි සහය ලැබේ. ……… මාලදිවයින් සරණාගතයින් ශ්‍රී ලංකාවේ වාර්ගික ජන අනුපාතය වෙනස්කර බෞද්ධ බලය සීමාකරනු ඇත.”

## ඉතිහාස කථා

“තප්‍රබෝනයට එපිටින් දූපත් 1578 කින් සමන්විත රාජ්‍යයක් තියෙනව” ටොලමි සඳහන් කළා. මාලදිවයින් පිළිබඳ පැරණිම වාර්තාව එයයි. ටොලමිගේ සිතියම් හා ලියවිලි අනුව භූගෝල ශාස්ත්‍රඥයින් කිහිප දෙනෙක්ම දූපත් රාජ්ජය ගැන සටහන් තැබුව. ඔවුන්ට බාහිරව ඉන්දියානු සාගරයේ සංචාරය කිරීම නිසා ලද දැනුමෙන් මාලදිව ගැන ලියූවන් ද ඉන්නව. පැපුස්, සොලක්ටිස්,

සුලෙයිමාන් සහ අල් මසූදීන් ඔවුන්ගෙන් කිහිප දෙනෙක්. 12 වන සියවසේ ජීවත් වූ අල් අදිරිසිගේ සටහන් ඒ හැමෝටම වඩා වැදගත් කමින් වැඩියි. අදිරිසි දූපත් රාජ්ජෙට ගිය මිනිහෙක්. "මේ රටේ රජ කරන්නෙ රැජිණක්. සුදු වස්ත්‍ර අඳින ඈ මැණික් ඔටුන්නක් පළඳිනව. එහි මුකුටය විශාල අලංකාර මැණිකක්. රාජ්‍යයේ කිසිම තැනක කාටවත් පාවහන් පළඳින්ඩ තහනම්. රැජිණ පමණක් රත්රන් පාවහන් සහලක් පළඳිනව. ඈ පිරිවර දසියන් සමගින් පෙරහැරේ ඉස්සරහින් යනව. ඊට පස්සෙන් තරමක් දුරින් මගුල් ඇතා සමග ඇමතින්, සංගීතකරුවන් සහ ජනයා ගමන් කරනව" ආදී ලෙසට ඔහු ඇසින් දුටු දෑ ලියා තිබ්බ.

මොරොක්කානුවකු වූ අබු අබ්දුල්ලා මොහොමඩ් හෙවත් ඉබන් බටූටා මාස 18ක් මහිලා දිවයිනේ වාසය කෙරුව. එමනිසා රට ගැන හුඟාක් තොරතුරු දැනගන්ඩ බටූටාට පුළුවන් වුණා. බටූටා යද්දීත් මහිලා දිවයින් මහමදිකයින්ට හසුවෙලා. ඒත් සම්ප්‍රදයට රැජිණක් රට පාලනය කළේ. "මේ රාජ්ජයේ රජ කරන්නෙ ස්ත්‍රියක්. ඇයගේ නම කදිජා රෙහෙන්දි" ඉබන් බටූවා ලියනව.

මහත් ප්‍රසිද්ධියක් ඉසිලූ චීන සමුද්‍ර යාත්‍රිකයින්ගෙ ලියවිලිවලිනුත් දිවයින් ඉතිහාසය විස්තර කරනව. විශේෂයෙන්ම මින් අධිරාජයාගේ ලිපිගොනු අතර මාලේ ගැන සටහන් තියෙනව. චීන භික්ෂූන් හා භික්ෂුණීන් වහන්සේලා ලොවේ දස දෙස ඇවිද්ද පිරිසක්. උන්-වහන්සේලාත් මහිලා දිවයින් ගැන ලියා තැබුව.

මාලදිවයින් පිළිබඳ වටිනාම වාර්තා සපයන්නෙ යුරෝපියොයි. එය ඇරඹෙන්නෙ ලොරෙන්සෝද අල්-මේදගෙන්. ඉන්දියානු සාගරයේ පෘතුගීසි බලය පිහිටුවීම සඳහා මූලික වූ ලොරෙන්සෝ තම පුතා අල්පොන්සෝ සිංහල දේශයට යවා එහි රජතුමා සමග මිත්‍ර ගිවිසුමකට එළඹුනා. වින්සෝ නම් නාවික නිලධාරියා යටතේ



හමුදවක් මාලදිවයිනට යැව්වෙ ඒ අතරයි. වින්සෝගේ හමුදවට මාලේ මහමදිකයින්ගෙන් නොයෙකුත් තර්ජන ආව. නමුත් ඔහු ආපසු හැරුනේ මාලේහි බලකොටුවක් හද බව පෘතුගීසි ලේඛනවල සඳහන් වෙනව.

වතේ වන සතුන් කුණකට එනවා වගේ පෘතුගීසි පස්සෙන් ලන්දේසි, ලන්දේසි පස්සෙන් ප්‍රංශයො, ඔවුන් පස්සෙන් ඉංග්‍රීසි එක වැළට ආව. මෙයින් ක්‍රි. ව. 1802 ජුලි 08 වැනිද මාලදිවයිනට සේන්දු වූ ප්‍රංශ නැව දිවෙහි පාලකයින්ගෙ අත් අඩංගුවට වැටුණ. නැව අබලන්ව තිබූ නිසා ඒ ඉරණම අත්වූ බව ප්‍රංශ වාර්තා කියනව. අත්අඩංගුවට ගත් ප්‍රංශ නාවිකයින් අතරින් ටික දෙනාටයි ජීවිත බේරා ගන්ඩ හැකි වෙන්නෙ. ප්‍රැන්සිස් පියරේ ද ලැවර් ඉන් එක් අයෙක්. පියරේ පාලකයින්ගේ විශ්වාසය දිනාගෙන දිවයිනේ පදිංචිකරුවකු වී සුලු සුලු වෙළඳාම් කරන්ඩ ගත්ත. වරෙක බෙංගාලයේ පාලකයා හා මාලදිවයින් සුල්තාන් අතර ආරාවුලක් ඇති වුණා. ඒ අවස්ථාව ප්‍රයෝජනයට ගත් පියරේ ඉතිරි සගයින් කිහිප දෙනාද සමගින් රටින් පැන ගත්ත. සිංහල රාජ්ජයේ සිරකරුවකුව හිටි රොබට් නොක්ස්ට සමාන කළ හැකි පියරේ ප්‍රංශයට ගොහින් තම අත්දැකීම් සංග්‍රහයක් ලිව්ව. ඉන් එක් කාණ්ඩයක් පිරෙන්නෙ මාලදිවයින් පිළිබඳ තොරතුරුවලිනුයි.

බ්‍රිතානිය යටත් විජිත කාර්යාලයෙන් මාලදිව් ගැන වාර්තා බොහොමයි. ඒවා අතර මාලදිවයින් ගැන තොරතුරු සෙවූ ලුතිනන් ජේ. ඒ. යන්ග් සහ ඩබ්ලිව්. ක්‍රිස්ටෝපර් බඳු නිලධාරීන්ගේ වාර්තා විශේෂයි. ලෝරන්ස් රොබින්ස් තොරතුරු සෙවූ තවත් නිලධාරියෙක්. ඉංග්‍රීසි කාන්තාවන් පවා ඒ වැඩේ සඳහා යෙදී තියෙනව. හුඟ දෙනෙක් මාලේ ගියෙ ලංකාවේ ඉඳලයි. ලංකාවේ ඉතිහාසය දැන ගැනීම සඳහා වෙහෙසුන එච්. සී. පී. බෙල් මාලදිවයිනේ ඉතිහාසය දැන ගැනීමටත් උත්සාහ දැරුව. ඔහු එහි ගොස් දූපත් ගානේ ඇවිදිමින් නොයෙකුත්

සොයා ගැනීම කළා. බෙල් කුමන පරමාර්ථයකින් මාලදිවයින් පිරුවත් ඔහුගේ වාර්තාව මාල දිවයිනේ මරා දැමූ බෞද්ධ ශිෂ්ඨාචාරය සටහන් කරන වටිනාම මරණ පරීක්ෂණ වාර්තාව වශයෙන් ඉතිහාස ගත වෙනව.

දිවෙහි වාසීන්ගේ භාෂාව ගැන උනන්දු වූ භාෂා වේදීන් ද ඉන්නව. ක්‍රිස්ටෝපර් තමා දිවෙහි භාෂා පර්යේෂණ පටන් ගත්තෙ. සිංහල භාෂාව ඉගෙණීම කළ ගෙ ක්‍රිස්ටෝපර්ගේ වාර්තා කියවා දිවෙහි භාෂාව හා සිංහල අතර සමාන කමක් දැක්ක. බෙනට් දිවෙහි සිංහල භාෂා සමානතා දුටු තවත් අයෙක්. දිවෙහි හා සිංහල භාෂා සසඳමින් එම භාෂා පිළිබඳ හොඳ විවරණයක් කළේ ජර්මන් ජාතික විල් හෙල්ම් ගයිගර් විසිනුයි. ඒ කටයුත්ත අරඹන්ඩ පෙර යුරෝපා රටවල තිබූ දීවෙහි රාජ්‍යය පිළිබඳ ලියවිලි පරීක්ෂා කළ ගයිගර්ට ලන්ඩන් යටත් විජිත කාර්යාලයේ මාලේ ඉංග්‍රීසි වචන කෝෂය හා කෝපන්හේගන් පුස්තකාලයේ තිබූ පවුල් බෝස්ගේ මාලේ වචන කෝෂය බොහොම ප්‍රයෝජන වුණා.

ගයිගර් මාලදිවයින් ගියා. ලංකාවේදී දිවෙහි භාෂාව දන්නා උගතුන්ගේ උදව් ලබා ගත්ත. තමා කොළඹ පදිංචිව හිටි කාලයේ දිවෙහි භාෂා අධ්‍යයනය සඳහා උපකාර කළ මාලේ සුල්තාන් පවුලට නෑකම් කියන ඊබ්‍රාහිම් ඩිඩී සහ මැන්දිස් ගුණසේකර මුදලිගෙන් ලද උපකාරය ගයිගර් සටහන් කර තියෙනව.

දිවෙහි භාෂාව ගැන ලිපි ලියූවන්ගේ නාමාවලී පවා යුරෝපා ලේඛනාගාර සතුයි. සයිමන් කාශි චෙට්ටි ජේම්ස් සිල්වා, මැන්දිස් ගුණසේකර හා ලූවිස් සොයිසා යන ලාංකිකයින්ගේ නම් එක ලේඛනයක අඩංගුයි. මෙබඳු කරුණුවලින් පෙන්වන්නේ යුරෝපීන් යටත් විජිත ගැන මොන තරම් උනන්දු වූ වාද යන්නයි. ඒ උනන්දුව තවමත් තියෙනව. යුරෝපා මානව විද්‍යාඥයින් රට රටවල සංස්කෘතික උරුමයන් හොයා ඇවිදිනව. ඒ අතර



යුරෝපය යටත් විජිත වශයෙන් තිබූ රටවල් ගැන වැඩි තොරතුරු ලබා ගන්ඩ වඩා පහසු ක්‍රම භාවිතා කරනව. රාජ්‍ය නොවන සංවිධාන හා ශිෂ්‍යත්ව දී යුරෝපයට ගෙන්වන විද්‍යාර්ථීන් කරන්නෙ යුරෝපයට ඔත්තු සැපයීමයි. ආචාර්ය උපාධි සහ ඩිප්ලෝමා පතන උගතුන් ඉතාම වැඩි දෙනා දැන හෝ නොදැන කරන්නේ නිබන්ධනය නමින් තම රට ගැන සත්‍ය වාර්තාවක් අධ්‍යාපන ලබන රටට නොමිලයේ සැපයීමයි. එබැවින් රට පාවාදී ආචාර්ය උපාධියක් ලබන උගතාත් මස්මඩුවේ මස් කපන්නාත් කුලියට මිනී මරන්නාත් පරමාර්ථ වශයෙන් එක සමානයි. එකම ක්‍රියාවක යෙදී ඉන්නව.

ප්‍රසිද්ධ ආචාර්යවරුන් යොදවා මාලදිවයිනේ ඉතිහාසය ලියවීමට එහි පාලකයින් මහන්සි දරා ඇති බවක් පෙනෙනව. එය වරදක් නෙමේ. නමුත් උපාධි නමැති ලේබල් ඇතුවාට නිතරම කුලී උගතා කටයුතු කරන්නේ මුදල් සහ වාසි බලාපොරොත්තුවෙනුයි. මාල දිවයිනේ ඉතිහාසය ලෙසින් කුලී උගතුන් ලියා ඇත්තේ ද පාලකයින් සතුටු කරන කථා මිස සැබෑ ඉතිහාසය නෙමේ. ඉතිහාසය යනු සිදුවූ දේ මිස පුද්ගලයන් සතුටු කරන්ඩ ලියන ප්‍රශස්ති නොවෙයි.

යුරෝපයේ ලේඛනාගාර හා පුස්තකාලවල හංගාගෙන සිටින ආසියාවේ පැරණි ලේඛන හා පොත්පත් මෙන්ම ආසියාව ගැන ලියවුන පොත්පත් එමටයි. ලේඛනාගාරයක තියෙන මාලදිවයින් කථා සංග්‍රහයක් ගැන අපට දැනගන්ඩ ලැබුණ. කථා සංග්‍රහයේ සූළ මුළ මේකයි.

පාප් ලෝක සිතියමේ ඉරක් ගහල රණ්ඩු නොකර රටවල් මංකොල්ලකන්ඩ ස්පාඤ්ඤයට, පෘතුගාලයට පාර පෙන්නුවට ස්පාඤ්ඤය තමන්ට අයිති නැති රටවල් ගැනත් හොයා බැලුව. ඔත්තුකාරයින් යැව්ව. මලක්කාවට යවපු ඔත්තුකාරයෙක් පසුව මාලදිවයිනට ගිහින්

එහි ගැහැණියකුට එක්වෙලා බින්න බැස්ස. ඔහු මහමදගම වැළඳගෙන අබ්දුල්ලා ෂාවි කිය නම ගත්ත. ස්පාඤ්ඤයට ආ විටක රාජ්‍ය නිලධාරියෙක් සමග කථාවේ වැටුණු අබ්දුල්ලා, ''මාලදිවයින මහමදික රටක් වුනාට ඉස්සර බුදුන්ගේ රටක්; රටවැසියන්ට කිව්වෙ දිවෙහි සිංහලයො කියලයි; සිංහලයො මාළු ඇල්ලුවෙ නෑ; ගොවිතැන් කළා, රෙදි වියුව, දිවෙහි සිංහලයො මස් නිපදෙව්ව; නැව් පහුරු හා දෝනිවලින් දෙරට අතර භාණ්ඩ හුවමාරු කරන්ඩ කරව සහ මාගම්මු කියා වෙනම පිරිස් හිටිය; දිවෙහි රටට බාබෙරි හමුදුවක් කඩා පැනල මහ රැජිණ අල්ලා මැරුව; බාබෙරි නායකය රැජිණගෙ දියණිය පාවා ගත්ත; බාබෙරි හමුදුව බුදුන්ගෙ ධර්මය උගන්නපු භික්ෂු භික්ෂුණීන් වහන්සේලා සේරම අල්ලල මුතු වේරු දූපතට ගෙනිහින් මැරුව; කාපේරි වහලුන් යොදවා සංඝාරාම එක්දහස් පන්සියම බින්දෙව්ව; දිවෙහි සිංහලයො හරි ලස්සන කථා දැන ඉඳල තියෙනව'' කියමින් මාලේ ජන කථා කීපයක් කිව්ව. නිලධාරියා අබ්දුල්ලා ගැන කාලෝස් රජ්ජුරුවන්ට දැන්නුව. රජතුමා ඔහු කැඳවා විස්තර අසා සතුටු වී අබ්දුල්ලා දන්නා සියලුම කථාන්දර ලියා රාජ්‍ය ලේඛනාගාරයේ තැන්පත් කරන්නැයි ලේඛන නිලධාරීන්ට නියම කළා. අබ්දුල්ලා තුන් මාසයක් තිස්සෙ කී කථා සංඛ්‍යාව ගණනින් දෙසීයකට වැඩියි.

ඒ කථා අතර මාලදිවයින් ගිලගන්ඩ මුහුද සැරසුන හැටිත් අනාගතයේ දිවයින් ගිලගන්ඩ මුහුද සැරසෙන වගත් කියවෙන කථාවකුත් අඩංගුයි. ඒක මෙහෙමයි: බෝධි මාලා දේවි රැජිණ දවසේ දී හඳ සමග රණ්ඩු වූ කදුර සැඩවෙලා චන්ද්‍රකාන්ති දූපත් පෙළ ගිලගන්ඩ සූදනම් වුණා. කදුරට බිල්ලක් දී කදුර සතුටු කරන්ඩ කියා නායක නැකති කිව්ව. බෝධිමාලා රැජිණට සුමාලී කියල බොහොම පින්වන්ත ඒ වාගෙම ලස්සන දියණියක් හිටිය. චාරිත්‍රයේ හැටියට රට බේරා ගන්ඩ කදුරට බිලි



දෙන්ඩ සිදුවුණේ සුමාලී කුමාරියවයි. සුමාලී කුමාරී කදුරට බිලි දෙන්ඩ නැවක් සූදනම් කරනු දැකපු මහා බෝධිය වඩින්ඩ පැමිණි ලිහිණියෙක් වහාම පියහු දිවයිනට පියඹා ගිහින් ඒ බව රහත් හාමුදුරුවරුන් වෙත දැන්නුව. රහතුන් තුන් නමක් මාලා නුවර මහාබෝධි මූලයට අහසින් වැඩල සත්‍ය ක්‍රියා කළා. රැජිණ උන්-වහන්සේලා ලඟට ආව. ''දිවෙහි රාජ්‍ය ගොඩ නංවලා තියෙන්නෙ කදුර විසින්. ධාර්මික රැජිණියන් රට පාලනය කරනතාක් කදුර සැඩවෙමින් නිහඩ වෙනව. ඒක තමා කදුරේ ගතිය. වසර එක්දහස් පන්සියයක් ගිය තැනේ දී භයානක හොර හමුදුවක් ඇවිත් රාජ්ජය කොල්ලකා දිවයින් ලෙයින් නාවනව. උන් එක සංඝාරාමයක් ඉතුරු කරන්නෙ නෑ. කසා පොටක් නැතුව යනව. උන් අවුරුදු එක් දහස් පන්සියක් තිස්සෙ මහ පොළවට හා කදුරට අප්‍රමාණ හිරිහැර දෙනව. කදුර කෝප වෙන්නෙ එතකොටයි. අහස උසට නගින මහා ජල කඳන් දූපත් සේරම ගිල ගන්නව'' කියා වදරළ රැජිනට හා රටට සෙත්පතා සුමාලී කුමාරිට සූදනම් කළ නැවට ගොඩ වුණා. නැව සැඩ කදුරට ඇතුල් වුණා. කදුර ගොළු වී පාවඩයක් වුණා.

## බර්බරයෝ

ඉබන්බටුටා අහපු විදිහට මාලේ දිවයින් වැසියන්ට රත්නමාරී කියන මුහුදු රකුසාගෙන් බොහොම කරදර ආව. රජ්ජුරුවො රකුසගෙන් ගැලවෙන්ඩ බැලුවෙ අවුරුද්දකට වරක් කන්‍යාවක් බිලි දීලයි. එද සිටන් අවුරුද්දක් පාසාම ලස්සන කෙල්ලක් තෝරල රත්න-මාරීට දෙනව. දෙවියන් වහන්සේ මොරොක්කෝවේ සිට

පැමිණි අබ්දුල් රිකාබ් යුසුබ් අල් තබ්රයිසිට ඒ අවුරුද්දෙ බිල්ලට තෝරාගත් කෙල්ලගෙ පවුලෙ අය මුණ ගැස්සුව. ඔවුන්ගේ දුක් කථාව හා රත්නමාරි රකුසා ගැන විස්තර ඇසූ තබ්රයිසි රකුසා එන දිනයේ කන්‍යාව වෙනුවට වෙස් මාරු කරගෙන නියමිත ස්ථානයට වෙලා ඉඳල රකුසා එනවත් එක්කම කුරාණය කියවන්න ගත්ත. රකුසා දුවන්ඩ ගත්ත. ඌ එදයින් පස්සෙ ආයෙත් ආවෙ නැහැ. රජ්ජුරුවො තබ්රයිසිගේ වීර ක්‍රියාව අසා හරියට සතුටු වුණා. ඔහු බුද්ධාගම ඉවත ද මහමදගම වැළඳ ගත්ත.

ඉස්ලාමිකයෙක් වූ ඉබන්බටුටා මේ කථාව ඇහුවෙ බර්බරයකුගෙනුයි. මුහුදට හා රකුසන්ට කාන්තාවන් බිලිදෙන තවත් කථා දිවෙහිත් වාගෙම සිංහලයන් අතරත් තිබුණ. විහාර මහා දේවිය පිළිබඳ කථාව උදහරණයක්. අබ්දුල්ලා කී කථාවක් මෙහෙමයි: නාරන් දූවෙ හිටිය සුවඳ කියල ගොවියෙක්. සුවඳ මුගොරිදූවෙ හේනක් කෙටුව; හේනෙ කැකිරි, තියඹරා, බටු මිරිස් බොහොම සරුවට වැවුන. සුවඳගෙ පවුලගෙ නම ලමී. ඒකි දවසක් කුප්පි (කෙල්ල)ක් එක්ක හේන බලන්ඩ ගියා. රකුසෙක් කෙල්ලව දැකල කැදර හිතුව. ඌ පහුවද සුවඳ දූවට එනව බලාගෙන ඉඳල සුවඳගෙ දෝනිය (ඔරුව)ට නැගිල පද්දන්ඩ ගත්ත. ''උඹ මට මොන කරදරයක් කරන්ඩ හදනවද?'' කියල සුවඳ ඇහුව. ''මට උඹෙ කුප්පි ඕනැ'' රකුසා කිව්ව. ''ඕකට කලබල කරන්ඩ ඕනැයැ. වරෙන් හෙට අපේ ගෙදර'' සුවඳ කිව්ව. ''මාමේ එහෙනම් හෙට හවස උඹේ දූව ගන්ඩ එනවා'' කියා රකුසා කදූරට පැන්න. සුවඳා ගෙදර ආවෙ බාගෙට මැරිල. ''උඹට මොනා වෙලාද?'' ලමී ඇහුව. සුවඳ සිද්ධ වෙච්ච වින්නැහිය කිව්ව. ''උඹ බය නොගෙන හිටපන්. මං ඕකට කුප්පියෙක් දෙන්නම්කො'' ලමී කිව්ව. ඒත් සුවඳට නම් හිතේ සතුටක් ඇවෙ නැහැ.

පහුවද හවස රකුසගෙ හූ ශබ්දය ඇසෙන්ඩ ගත්ත. පුයියව අටුවට යැව්ව ලමී පිලේ වාඩි ගත්ත. රකුසා හූ



තුනක් කියල කඩුල්ල පැනල ඇවිත් ''කෝ බොල ගැණියෙ ගොයිය?'' කියා ඇහුව. ''ගදයෙක් එනව කියල මන්තර පුරෝගන එන්ඩ පන්සලට ගියා. ඉක්මනට එයි. වරෙන් විටක් කන්ඩ'' කියල ලමී රකුසාට ළගට අඩගැහුව. ''මොකට මන්තර?'' කියමින් රකුසා ලමීට ලං වුණා. ලමී බුලත් පයිය රකුස අතට දීල වටපිට බලල රහසින් ''අපේ මිනිහ මහ තපුර බන්. ඇහට මන්තර පුරෝගන්ඩ දන්නව. වැරදිලාවත් කාට හරි ඇහිල්ලෙන් ඇන්නද උන්දූ ඉවරයි. ඊයෙ බඩ විරේක කරල හිටි හින්ද ගදය බේරිලා ගියා කියල තෙපර බබා හිටියෙ. ටිකක් හිටපන්කො. අද රකුස් අඩව් බලන්ඩ පුළුවනි'' කිව්ව රකුසට දූන් දෙගිඩියාව. ''මීට පාළොස් අවුරුද්දකට ඉස්සර ගොයිය මාව ගෙනාද දෙන්නා අතර හුරතලේට බහින් බස් වීමක් ඇතිවුණා. 'ගොයිය උඹේ කට වැඩියි' කියල මේන් මෙහෙම මගෙ ඇහට සුලැහිල්ලෙන් ඇන්න'' කියල රකුසාගේ ඇහට සුලැහිල්ලෙන් ඇන්න ලමී ''ගොයිය මන්තර පුරෝගන ඉන්න වග මං දූනගෙන හිටියෙ නෑ බං. මෙන්න පාළොස් අවුරුද්දකට ඉස්සර වැදිච්ච සුලැහිල්ලෙ පාරෙ සැර'' කියල තමන්ගේ ඇඳිවත මෑත් කර පෙන්නුව. එද ලමීගෙ ශුද්ධවීමේ දවස.

ලමීගෙන් රකුසගෙයි දෙබසට කන්දීගෙන අටුවෙ හිටි සුවඳගෙ නාහෙට දූවිලි ගිහින් කිවිසුමක් පිටවෙච්චි. රකුස දුවන්ඩ ගත්ත. ඌ බුලත් පයියත් එල්ලගෙන තාමත් දුවනවලු.

බෞද්ධ රජ්ජුරුවො මහමදගම වැළඳ ගත්තාය කියන කථාව බටුටාට කිව්වෙ බර්බරයෙක්. මහිලා දිවයින්වලට කඩා පැන්නෙ පර්සියානු වෙරළෙ ඉඳල පිටවුන බර්බර හමුදවක්. බර්බරයො කියන්නෙ ඉතාම ප්‍රසිද්ධ මුහුදු බල්ලො. දිවෙහි රාජ්ජෙට පැන්න බලු හමුදවෙ නායකයගෙ නම අබු අල් බර්කත් යුසුප් අල් බර්බර්. ඔය කාලෙ ලෝකයේ බොහොම ස්ථානවල මුදූ බල්ලො රජ කළා. කොටින්ම ඉංග්‍රීසි අධිරාජ්‍ය ගොඩ-

නංවන්නෙත් මුදු බල්ලො. ඉංග්‍රීසි රැජින බලු කණ්ඩායමේ නායක ප්‍රැන්සිස් ඩ්‍රේක්ව නයිට්වරයෙක් කළා. එදා ඉඳල තමයි හොරු සර් පදවිය භාවිතා කරන්නෙ. බර්බරයො සිංහල රාජධානියටත් තර්ජනය කළා. උන් බේරුවල තොට ඇල්ලුව.

තවත් මහමදික ජනප්‍රවාදයක් විදිහට කොයි මාලා කලෝ කියන කුමාරය සිංහල රජ්ජුරුවන්ගෙ දූ කුමරියක් පාවාගෙන නැව් දෙකකින් මුහුදේ ගමන් කරමින් සිටිද්දී කුණාටුවකට හසුවෙලා මාලොස් මඩුලු අතොලුවෙ දූපතකට ගහගෙන ආව. දූපත්වාසීන් රජ යුවල පිළිගෙන තමන්ගෙ රටේ රජකම භාර දුන්න. රජ යුවල කලක් මාලොස් මඩුල්ලෙ ඉඳල මාලේ දූපතට ගියා. ඒ අතර තවත් නැව් දෙකක් සිංහල රටට යවල තව නෑදෑයින් ගෙන්නුව. මේ රජ්ජුරුවන්ටයි බිසොවටයි හම්බවුණ දරුවාට කලමින්ජා කියල නම තිබ්බා. කලමින්ජා පිය රජ්ජුරුවන්ගෙන් පස්සෙ රටේ රජකම බාරගෙන බෞද්ධ රජෙක් විදිහට ඉඳල පස්සෙ මහමදගම වැළඳ ගත්ත.

ලංකාවේ වංශකථාවලට දන්නා අපහාස කරමින් ඉංග්‍රීසියෙන් ලිපි ලියූ ලංකාවෙ උගතෙක් කොයිමාලා කථාව ඓතිහාසික පුවතක් ලෙසට පෙන්වනව. ඔහු මාලදිවයිනේ පළමුවැනි බෞද්ධ රජ්ජුරුවො මහමදහම වැළඳ ගත්තෙ ක්‍රි. ව. 1153 දියි දිනයක් දෙනව. රජ්ජුරුවො එක්කල රාජ්ජෙම වැසියො මහමදගම වැළඳ ගන්නව. එවිට භික්ෂු භික්ෂුණීන් වහන්සේලා හැමෝම බුදු පිළිම කඩා බණපොත් පුළුස්සා පන්සල් කඩා ඒවා මත මරක්කල දේවස්ථාන හදමින් විප්ලවයක් කරනව.

අබ්දුල්ලා ෂාවි කී කථාවක් දැන් ලියන්නෙ. සුමන නාග රාජයා හදපු පහළගම් දූවෙ සඳකුම් විහාරයේ දීපංකර කියල රහත් හාමුදුරු නමක් වැඩ විසුව. උන්වහන්සේට ආදරය නොකළ කෙනෙක් නෑ. මූදේ මසුන් පවා



උන්වහන්සේව බලන්ඩ එනව. මුල්ලු (තල්මසුන්) හඳපානේ වෙරළට බඩගා උන්වහන්සේ ගාථා කියන හඬ අහල සාදුකාර දෙනව. එමනිසා කවුරුවත් පහළගම දූව අසල මූදෙ මාලු ඇල්ලුවෙ නෑ. කලීෆාට බරු කියල වහලෙක් හිටිය. ඌ දවසක් පහළගම් දූවට ගිහින් දීපංකර හාමුදුරුවන්ට කථා කරල ''කදුරට ගිහින් මාලු ටිකක් අල්ලගෙන ඇවිත් අපිට කන්ඩ උයපන් කිව්ව.'' රහතුන් වහන්සේ සිනාසුණා. බරු දීපංකර හාමුදුරුවන්ගෙ කන් කැපුව. උන්වහන්සේ සිනාසුණා. නාසය කැපුව. උන්වහන්සේ සිනාවුණා. අත් කපා දැම්ම. උන්වහන්සේ සිණා වෙමින් අපවත් වුණා. බරුව කළ අපරාධය අහපු ශ්‍රද්ධාවන්තයින්ගෙ පපු පැලී ගියා. මුල්ලු පහළගම් වෙරළට ඇවිත් දිවි නසා ගත්ත.


අබ්දුල්ලා කියපු තවත් කථාවක් විදිහට ලෝකයේ එකම මහිලා රාජ්‍යය වූ මහිලා දිවයින් ආක්‍රමණය කිරීම නීච වැඩක් කියල සම්මතයක් තිබුණ. සොළී රජ්ජුරුවො ඒ සම්මතය බිඳිමින් දිවෙහි රාජ්ජෙට පි පාලන් යටතෙ බළල් හමුදවක් ඇරිය. පි. පාලන්ගෙ හටයො නාග මණ්ඩලයට වැදිල විහාර කොල්ලකමින් ස්ත්‍රීන් දූෂණය කරමින් රට අමු සොහොනක් කළා. සොළී රජ්ජුරුවො තවත් හමුදවක් සිංහල රටට යවල සිංහල රජ්ජුරුවන්ව අල්ලා ඇස් උගුල්ලා සොළී නුවරට ගෙනාව. සොළී රජ්ජුරුවන්ගෙ සේනා බලය ගැන දුර බැහැර රාජධානි පවා බයට පත්වුනත් ඔහු සමග සටනට යන්ඩ තරම් බලයක් කාටවත් තිබුණෙ නැහැ. මේ අතර සොළීන්ට හසු නොවී පැනල ගිහින් වනාන්තරයේ හැංගුන විජබා කියන සිංහල කුමාරයා සොළී රජ්ජුරුවන්ව පරද්දල සිංහල රාජ්ජය බේරා ගන්නව කියා හිතල වනාන්තරේ ඉඳගෙන හමුදවක් හැදුව. ඔහු ගුන්දර හමුදවකුත් හැදුව. ''අපේ සහෝදරියන්ගෙ මහිලා රටට කළ අපරාධය හින්ද සොළී රජු එක්ක හූ දේවිය අමනාප වෙලයි ඉන්නෙ. කදුර අපේ පැත්ත ගන්නව. සොළී රජුගෙ බලේ ඇත්තෙ නැව් හමුදවෙයි.'' විජබා කුමාරය තම හමුදවට කිව්ව.

සොළී රජ්ජුරුවො හැම අවුරුද්දකම දින හතක් තිස්සෙ සඳ දෙවියො වෙනුවෙන් පූජාවක් පවත්වනව. ඒ දින හතේම සොළී රටේ වැසියො සැනකෙළි පවත්වනව. අන්න ඒ හත් දිනය උදාවෙච්ච දවසෙ විජබා කුමාරයගෙ ගුන්දර හමුදාව ගුන්දර තොටින් සොළී රට බලා පිටත් වුණා. හැම ගුන්දරයක්ම තෙල් වර්ගවලින් පුරවා තිබුණා. හෙමින් සිරුවෙ සොළී නැව් හමුදාව වෙත ගිය ගුන්දර, නැව් වටා තෙල් අතුරා සොළී නැව් හමුදාව එකම ගිනි ජාලයක් බවට පත් කළා. විජබා කුමාරයාගේ ක්‍රියාව අහපු අසල් රටවල් සියල්ලම සොළීන්ට විරුද්ධව යුද්ධ කරන්ඩ ගත්ත. සිංහල රාජධානිය නැවත පිහිටා වූ විජබා කුමාරය දිවෙහි රාජ්‍යෙට සේනාවක් එවල පි පාලන්ගේ හමුදාව පරදවා වජීරමාලා දේවියට සිංහාසනය හද දුන්න.

මාලදිවයිනේ බටහිර දූපත් අතර ගාෆු අලිෆු හෙවත් හුවදූ මඩුල්ලෙ ගද්දූ කියල ජනාකීර්ණ දූපතක් තියෙනව. දූපතේ දිග මීටර 400යයි. පළල මීටර 200යයි. ගද් දූපතට එපිටින් මනුෂ්‍ය ජනාවාස නැති ඉතාම සරු සාරවත් ගන් දූපත ජනාශූන්‍යයි. බෝවෙන රෝග හැදී මළවුන්ගේ මිනී සොහොන් කරනවා හැර ගන් දූපතේ පදිංචි වෙන්න කවුරුත් බයයි. පාලකයින් කියන්නෙ ඉස්සර බළල් හමුදාවක් පැනල දූපත් වාසීන් සියල්ලම මරා දැමුව. එනිසා ගන් දූපතේ පදිංචිවීම අශුභ විදිහට මඩුලු වැසියො සලකන බවයි. ඔවුන් ගන් දූපත බළලුන්ගේ දූපත වශයෙන් හඳුන්වනවාලු. මාලදිවයිනේ ඉතිහාසය ලිව්ව කුලී ආචාර්යවරයෙක් සිංහල බෞද්ධයින්ට නින්ද කිරීමේ පරමාර්ථයෙන් ‘‘බළල් කථාවෙන් කියන්නෙ සිංහල ආක්‍රමණයක් සිංහලයෝ ඔවුන්ගේ දත් විලිස්සූන භයානක වෙස් මුහුණු පැළඳගෙන ගොහින් ගන් දූපතේ හින්දූන්ව ආක්‍රමණය කළා. සිංහයා නොදන්න දූපත්වාසීන් සිංහ කොඩිය දැක බළලුන් රට ආක්‍රමණික කළාය’’ කියා ලිව්වා.


ගන් දූපතේ බෞද්ධ නටබුන් බොහොමයි. වදමග හවිත්ත නමින් චෛත්‍යකුත් තියෙනව. තෝර් හයර් දල්









මුහුණු පහක් ඇති යක් කැටයමක්
(ඉස්ලාමීය යුගයට පෙර)





මාල දිවයින් විහාර භූමියක් (බෙල්ගේ පුරාවිද්‍යා පර්යේෂණ)



ෆුආ මුලකු කෙදරි දේවස්ථානය අසල පැරණි පොකුණ



මාලදිවයිනේ බෞද්ධ පුරා වස්තූන්

මාලදිවයින් ආණ්ඩුවේ අනුග්‍රහය ඇතිව ඉතිහාස පර්යේෂණයකට රටට ආ වෙලාවේ මෙම ස්ථානයේ පිහිටි විශාල ගොඩනැගිලි සංකීර්ණය හින්දු ගොඩනැගිල්ලක් යයි කිව්ව. හයර්දල් ඉතිහාසඥයෙක් හෝ පුරා විද්‍යාඥයෙක් නෙමේ. ආසියාවේ බෞද්ධ ඉතිහාසය හෝ බෞද්ධ කලා වස්තු ගැන වැටහීමක් නැති ඔහු පුරාවස්තු පිළිබඳ නොයෙකුත් කථා කියනව. සිංහල බෞද්ධයන්ට නින්දා කිරීමට අවශ්‍ය උගතා හයර්දල්ගේ ඒ කථාව වාසියට ගත්ත. හයර්දල්ට මෙම ස්ථානයෙන් බුද්ධ ප්‍රතිමාවක් සහ සිංහ රූප දෙකක් ද හමුවූ බවක් ඔහු කියන්නේ නැහැ.

සම්මතය නොසැලකූ සොළී හමුදවක් දිවෙහි රාජ්ජය ගන්ඩ කඩා පැන්න බව අබ්දුල්ලා කියනව. කොටියා සොළී කොඩියේ ලකුණයි. දිවෙහි වාසීන් කොටියා දන නොහිටියා කියා අප හිතිය යුතු නැහැ. ඔවුන් කොටියාට නින්දා කිරීම සඳහා ඌ බළලෙක් ලෙස හඳුන්වන්ඩ ඇති. දෙමළ කොටි කණ්ඩායමක් ඉතා මෑත කාලයකත් මාලදිවයින් අල්ලා ගන්ඩ හැදුව.

ගන් දූපත පාලුවීම හා මෙම බළල් කථාව එකිනෙකකට සම්බන්ධ කථාවක් නෙමේ. අබ්දුල්ලා කියන විදිහට බාබේරි හමුදව දිවෙහි රාජ්ජේ භික්ෂු භික්ෂුණීන් සේරම අල්ලා මුතු වේරු දූපතට ගෙනිහින් මරා දැම්ම. ඒ අපරාධය ඉවර වෙද්දී දූපතේ පදිංචි වී සිටි බාබේරීන් සේරටම මසූරිකා රෝගය හැදිල උන් ඔක්කොම මිය ගියා. කලීෆා හෙවත් කලීෆාගෙන් මසූරිකාවෙන් බේරිලා පැනල යද්දී නාග විහාර භූමියේ දී හෙනයක් වැදිල මැරුණ. ඔහුගේ මල සිරුර නාග විහාර භූමියේ ථූපාරාම හවිත්තට නුදුරින් වළලා සොහොනක් ඉදි කළා.

ගන් දූපතේ සිට සීනු ආනාල්ලට එද්දී හමුවෙන්න ෆුආ මුලකු හෙවත් නාවියනි නම් දූපත් මඬුල්ලයි. ෆුආ මුලකුහි දූපතක තමා අබ්දුල්ලා ෂාවී වාසය කළේ.

ඉන්දියානු සාගරයේ ගමන් කරන්නන්ට ඉතා වැදගත් වූ මෙම දූපත්වල ඉබන් බටූටාත් නැවතී හිටිය. ෆුආ මලකු දූපත්හි වැඩිපුර හිටියෙ දිවෙහි රාජ්‍ය හා ලංකාව අතර වෙළඳ කටයුතුවල යෙදුන සිංහල වෙළෙන්දො. ෆුආ මලකු දූපත් කීපයේ බෞද්ධ නටබුන් බහුලයි. හුදුවූ ගමට සමීපව වෙරළ ආසන්නයේ රෙද්දින්ගෙ ෆුනි (රහතුන්ගේ කන්ද) නම් අලංකාර ස්තූපයක නටබුන් දකින්ඩ හැකියි. ස්තූපයේ උස මීටර 20යි. පාදමේ වටය මීටර 75යි. දුන් එය ඉතා අබලන් වී ඇතත් 1922දී බෙල් මෙම දූපතට යන විටත් ස්තූපය යහතින් පැවතුණා. සුදු පිරියම සහිත සන්ධ්‍යාකාර හැඩය ඇති ස්තූපය ගැන බෙල් වාර්තාවේ දීර්ඝ විස්තරයක් අඩංගුයි. ඊට ආසන්නයේ තවත් කුඩා ස්තූප දෙකක්ද ඒ මධ්‍යයේ මාළුවෙක් ඔසවා ගත් නග්න ස්ත්‍රියකගේ හා පුරුෂයෙකු ගල් ප්‍රතිමා පුවරුවක් ද දක්නට ලැබුණා. බෙල් ස්තූප බිමෙන් සොයාගත් අලංකාර බුද්ධ ප්‍රතිමා වහන්සේ මාලේ කාලකයින් වෙත බාර දුන්න.

දිගුවාදු දේවස්ථානය සද ඇත්තේ රෙද්දින්ගෙ කන්ද නමින් හඳුන්වන ස්තූපයට සම්බන්ධ විහාරය බිඳ ගත් ගලිනයි. අබු අල් බර්කත් යුසුප් අල් බර්බර්ගේ පුත් අබ්දුල් නයිබ් කාලගෙෆනන්ගේ සොහොන ඇත්තේ ඒතනයි. බර්බර කථාවලට අනුව නම් සීනු අටොල්ලේ මී දූවට ආ මුල්ම අරාබි පිරිස එතනින් ෆුවා මලකු වෙත ආව. කලගෙෆනගේ සොහොන හැදුවේ ඒ ගමන සිහිවෙන්ඩයි. ෆුආ මලකුහි දදි මගු ගමේ කෙදේරි දේවස්ථානය හැදුවෙත් විහාරයක් උඩයි. විහාර බිමේ වූ අලංකාර පොකුණ පමණක් තාම ප්‍රයෝජනයට ගන්නව. පොකුණේ වට ප්‍රමාණය අඩි 54යි. ගැඹුර අඩි හතරයි. එය කැපූ ගල්ලැලි අතුරා තනන ලද අලංකාර පොකුණක්.



## මහිලා දිවයින්

දිවෙහිවල ගමු හැදීම පටන් ගත්තෙ ලංකාවෙ සිට පැමිණි යකුන් හා නාගයින් විසිනුයි. ඉස්සර ලංකාද්වීපය බලසම්පන්න යක්ෂ රාජධානියක්. ඒ රට මුහුදේ ගිලුන බව කියවෙනව. මුහුදේ ගිලුන ලංකාවක් ගැන කථා සිංහලයින් අතරත් තියෙනව. ''ලක්ෂයක් පමුණු ගම් හා නවසිය හැත්තෑවක් කෙවුලන්ගේ ගම් හා සාරසිය සැත්තෑවක් මුතු කිමිදෙන ගම් ඇතුලුව ලංකාවෙන් දොළාහත් එකක් මුහුදට ගිලි ගියහ''යි රාජාවලිය නමැති ඉතිහාස ග්‍රන්ථයේ සඳහන් කර ඇත්තෙ කිසියම් ඓතිහාසික මූලාශ්‍රයකට අනුවයි.

ගමු කීපයක් එක්වූ විට ඊට මඩුල්ලයි කිව්ව. මුලදී මඩුල්ල කුඩා රාජධානියක්. ඉස්සර ලංකාවේත් මඩුලු තිබුණ. දිගාමඩුල්ල උදාහරණයක්. දිවෙහි රාජ්‍යේ ප්‍රසිද්ධම මඩුල්ල දකුණු දූපත්හි නාග මඩුල්ලයි. නාග මඩුල්ලෙ නාග රජවරුන්ට නාගදීපෙ, කල්‍යානි පුරේ හා මුචලින්ද නුවර නාග රජවරු නෑදෑයො. එද නාගදිපය වර්තමාන ශ්‍රී ලංකාවේ යාපා පටුනයි. කල්‍යානි පුරය තමා ශ්‍රී ලංකාවෙ නැගෙනහිර පලාතෙ කල්කුඩා කියන ප්‍රදේශය. මුචලින්ද පුරය දකුණු ඉන්දියාවේ මසුලිපතාන් වරාය ප්‍රදේශයයි. මසුලිපතානය ගොඩ නැංවූයේ මහා මුචලින්ද නාගරජ්ජුරුවෝ විසිනුයි. ඉතිහාසඥයින් සඳහන් කර ඇති විදිහට බුද්ධ චරිතයට සම්බන්ධ මුචලින්ද නාගයා මිථ්‍යා සත්වයෙක් නෙමේ. ඔහු තමා මුචලින්ද නුවර ගොඩනැංවූ මුචලින්ද නා රජතුමා. බුදු හාමුදුරුවො මුචලින්ද නුවරට කිහිප වාරයක්ම වැඩම කළ බවට සාක්ෂි තියෙනව. මුචලින්ද රජතුමා අශෝක රජතුමා තරම් බලගතු අධිරාජ්‍යයක් ගොඩනැංවූවේ නැතුවාට බුද්ධ ශාසනය ගොඩ නැංවීම සඳහා විශාල සේවයක් කළා. ඒ බුදුන් ජීවමාන කාලයේදීමයි.

මුචලින්ද නා රජ්ජුරුවො නාග ලෝකයටත් ලංකාවෙ යක්ෂ රාජධානිවලටත් බුදු හාමුදුරුවන්ව වැඩම කෙරෙව්ව. බුදු හාමුදුරුවො තුන්වරක් ලංකාවට වැඩම කළ බව පාලි වංශ කථාවන්හි සඳහන් වෙනව. වරකදී නාග මඩුල්ලට වැඩම කළ උන් වහන්සේ එහිදී ප්‍රඥා පාරමිතා සූත්‍රය දේශනා කළා. වර්ධන නාග රාජයා ප්‍රඥා පාරමිතා සූත්‍රය ග්‍රන්ථාරූඪ කරවා නාග මඩුල්ලේ තැන්පත් කෙරෙව්ව. ඒ බව ඇසූ නාගර්ජුණ මහ රහතන් වහන්සේ නාග මඩුල්ලට වැඩම කර ප්‍රඥා පාරමිතා සූත්‍රය ලබා ගත්ත. නාගර්ජුණ තෙරුන් වහන්සේ නාග ලෝකයෙන් ලබාගත් ප්‍රඥා පාරමිතා සූත්‍රය ශ්‍රී පර්වතයේ දී දේශනා කිරීමේ ප්‍රවෘත්තිය මහායාන මූලාශ්‍රයන්හි මැනවින් විස්තර වෙනව.

අබ්දුල්ලාගේ කථාන්දර සංග්‍රහය කියවා දිවෙහි රාජ්‍යය ඉතිහාසය දැන ගන්ඩ පුලුවන්. නාග මඩුල්ලෙ සොමි ගුණ නා රජ්ජුරුවො හීනයක් දැක්ක. කඳුර දිගේ ආව නාගයෙක් නාග මඩුල්ල වටේ තුන් වරක් කැරකී ගොහින් කිඳුරු දූවට ගොඩවී පෙනය පිම්බුවා. කුමාරි-කාවක් ඒ තුළින් එළියට ආව.

(දිවෙහින් වාගේම සිංහලයිනුත් මුහුදට කිව්වෙ කඳුර කියලයි. ඉස්සර කඳුරු කන්ද වර්තමාන ත්‍රිකුණාමලයයි. එය ද්‍රවිඩයින් කුදිරමලේ නමින්ද හඳුන්වා තියෙනව. යාපනේ කන්තරෝඩෙයි නමින් හඳුන්වන පූජනීය භූමියේ පැරණි නම කඳුරුගොඩ. දිවෙහි රාජ්‍යයේ හවිත්ත වැඩිම සංඛ්‍යාවක් ගොඩනංවා තිබුණෙ කඳුරුගොඩ විහාරයේ චෛත්‍ය සැලැස්මටයි)

තව සත් දිනකින් දිවෙහි රාජ්‍ය සියල්ලටම නායක ඔටුන්න වෙන දේවියක් කිඳුරු දූවට එනව කියා නැකත් කරුවන් හීනය තේරුවා. ඒ කිව්ව වාගේම හත් දිනක් ගිය තැන කාන්තාවන් රැගත් නැවක් කිඳුරු දූවට පැමිණ ඇති වග රජ්ජුරුවො දැන ගත්ත. එහි ගිය රජතුමා



මුලින්ම මුණ ගැහුනේ කාන්තා පිරිසට නායිකා භූමිකා දේවියවයි.

"අපි ආවෙ සිංහ පුරයෙන්. සිංහපුරය කරන පියා මැරූ රජ්ජුරුවන්ගෙ අකටයුතු වැඩ ඉවසන්ඩ බැරි ඔහුගේ පුතා විජය කැරලි ගැසුව. රජ්ජුරුවො විජය සහ ඔහුගේ පිරිවර යක් ජනයා අල්ලා ඔවුන්ගේ භාර්යාවන් සහ දරුවන්ද සමගින් නැව් නංවා රටින් පිටුවහල් කළා. මුහුදේ කුණාටුවලට හසු වූ අපේ නැව් සී සී කඩ ගියා. මහා නාවිකාවී මමයි. විජය කුමරුට බිසෝකම් කළ සුරඹා දේවිය ඇතුව පිටුවහල් කළ ස්ත්‍රීන් හැමෝම ඉන්නෙ මගේ බාරයේයි" භූමිකා දේවිය සොමිගුණ රජ්ජුරුවන්ට කිව්වා. සුරඹා දුටු සොමිගුණ රජතුමා ඈ තමන්ගේ අග බිසව කරගන්ඩ අවසර ඉල්លුව. එය ඉටු කළ භූමිකා අභිමත පුරුෂයින් ලබාගෙන ජීවත්වීමට තමන් භාරයේ සිටි සියලුම ස්ත්‍රීන්ට අවසරය දී කෝඩු දූවට ගිහින් මෙහෙණියක් වුණා.

යක්ෂයින්ගේ රාජ්‍යයට පැමිණි විජය කුමාරයාට තම දියණිය පාවා දුන් යක්ෂ රජතුමා ඔහු සඳහා තම්බපණ්ණි කියා නුවරක් ද සාදවා දුන්න. විජය සහ පිරිවර එහි සිට තම අඹුවන් හා දරුවන් ගැන හොයා බලද්දී සුරඹා බිසොව නාග මඩුල්ලේ සොමිගුණ නා රජ්ජුරුවන්ගේ බිසෝ වී ඉන්නා බවත් අනිකුත් සියලුම ස්ත්‍රීන් තමන්ට අභිමත නාග පුරුෂයින් පාවාගෙන නාග මඩුල්ලේ ජීවත් වෙන වගත් දැන ගත්ත. පුතා මාණික්‍ය දූපතේ සාගර රජ්ජුවන්ගෙ දූ පාවා ගෙන අභිෂේක ලබා සිටින වග ආරංචි වුණා. සුරඹා දේවිය හා පුත් අභය තම රාජ්‍යයට ගෙන්වා ගැනීම සඳහා දූතයින් යැවූ විජය ඊට අපොහොසත් වී ශෝකයන්ම ඔත්පල වුණා. ඒ බව අහපු සුරඹා දේවිය දක්ෂ ඇඹුන් කරුවන් ලවා තමන්ගේ හා සොමිගුණ රජ්ජුරුවන්ගේ රූප සදවා ඇදුරන් පිරිසකුත් සමග තම්බ-පණ්ණියට යැව්ව. ඔවුන් සමහ පියගු දිවයිනේ භික්ෂූන් දෙනමක් ද වැඩිය. ගමන සඳහා නැව් පිළියෙල කෙළේ

මුහුදට අධිපති මලය රාජයායි. ඒ පිරිස තම්බපණ්ණියේ අගනුවර කාලපුසියේ (කල්පිටිය) පිහිටි තල විල ඉහත්-තාවේ පිහිටි තාල දෙවියාගේ විමානයටත් වැදි දෙවියාගේ තුග රුකටත් අතර මණ්ඩපයක් තනවා ප්‍රතිමා හිඳුවා විජය රජ්ජුරුවන්ට සෙත් පතා වෛද්දයක් කළා. එද පටන් හැම වසරකම වර්ෂා මාසයේ සොමිගුණ හා සුරඹා ප්‍රතිමා ඉදිරියේ එම උත්සවය පැවැත්වෙනව.

තම දියණිය කොයිමාලා සහ සොහොයුරු සුමිත්තගේ පුත් දේවා රැගත් නැවක් කාරදූවට ඇවිත්, සුමිත්ත ඔවුන් කැඳවාගෙන ජීම සඳහා තොටට ගියා යන සුබ ආරංචිය සුවය ලබමින් සිටි විජයට අසන්ට ලැබුණ. ඔවුන් දැක බලාගත් විජය අප්‍රමාණ සන්තෝෂයට පත්ව වහාම දේවාට තම්බපණ්ණියේ රජකම පවරා තම බිසොව කුවණ්ණාට දාව උපන් ජීවා කුමාරයාට කොයිමාලා විවාහ කර දී නගර ගුත්තික තනතුර පිරිනැමුව. නමුත් ජීවා කුමාරයා එම තනතුර බාර ගන්ඩ කැමති වූයේ නැහැ. ඔහු කොයිමාලා දේවියත් සමගින් නාග මණ්ඩලයට යාමට පිය රජුගේ අවසරය ගත්ත. නාග මණ්ඩලයට යන ජීවා සහ කොයිමාලා රැගත් නැව් කුණාටුවකට හසු වී යැවුනේ උතුරු දූපත්වලට අයිති මාලොස් මඩුල්ලටයි. මාලොස් මඩුල්ලට නායක පූර්ණ රජතුමා ආගන්තුකයින් කැඳවා ඔවුන් පිළිබඳ තොරතුරු විමසන විට දී සියලු නෑදෑ සබඳකම් හෙළිදරව් වුණා.

ජීව තම සොහොයුරියකගේ පුතා බව ඇසූ පූර්ණ රජතුමා ඔවුන්ට වෙනම නුවරක් හද දෙන්ඩ ඇසුවා. ඊට කැමති වූ ජීව හා කොයිමාලා පදිංචි වූ දූව රස්ගෙ තිමුයි.

කිඳුරු දූවට පැමිණි සුරඹ වල්ලි ඇතුලු මහිලා පිරිස නාග මඩුල්ලට කැඳවාගෙන යාම උතුරේ රාජධානිවල නොසතුටට හේතු වුණා. නොසතුට කාලයක් යනවිට උතුරේ හා දකුණේ රාජධානි අතර භේද ඇති කෙරුව. සාමාන්‍ය වැසියන් අතර පවා භේදය පැතිර ගියා. යුධ



කොලහාළ ලකුණු පහළවෙනු දකපු ලංකා පුෂියේ (පිටියේ) ලංකා විහාරයේ භික්ෂූන් පිරිසක් භද්‍ර තෙරුන් ගේ නායකත්වයෙන් පුවගු දිවයිනට වැඩම කළා. දිග්නාග තෙරුන් සමඟ සාකච්ඡා කළ උන්වහන්සේලා "ජීව රජුගේ හා කොයිමාලා බිසොවුන්ගේ දියණිය රූපමාලා කුමාරිය මණිනාග සහ සෝම යන කුමරුන් දෙදෙන සමග එකවර විවාහ විය යුතු" බව ප්‍රකාශ කළා. ඊට සියලුම රාජධානි එකඟ වූ නිසා නැකත් දිනයේ මහත් උත්සව සහිතව මංගලය පැවැත්තුව. ඊවේලේ සම්මත කරගත් ගිවිසුම අනුව කිඳුරු දිවයිනේ රූපමාලා දේවිය උදෙසා මාළිගා-වක් හැදුව. දූපත රාත්‍රියට නාගයින් බාර ගත්ත. දවල් කාලයට තේවා කිරීම යක්ෂයින්ට පැවරුනා. රූපමාලා දේවියට උතුරේ හා දකුණේ (යක්ෂ නාග) සලකුණු යෙදූ අලංකාර ඔටුන්නක් පැළඳෙව්ව. කිඳුරු දූව මාලා දූව නමින් ප්‍රසිද්ධ වෙන්නෙ එද ඉඳලයි. දවල් කාලයට නුවරින් යක් බෙරවලින් නිකුත් වෙන මධුර හඬ ඇසෙනව. රාත්‍රී කාලයට වස් දඬු හා වීනා නාදය ඇසෙනව. උතුරේ හා දකුණේ වැසියන් වෙනුවෙන් පරිවාර ස්ත්‍රීන් දෙසීයක් නුවරෙහි පදිංචි කෙරෙව්ව.

මාලා නුවරට පියදස්සි රජ්ජුරුවන්ගෙ ධර්ම දූතයින් ආවෙ ධර්ම මාලා රැජිණියගේ දවසේයි. දූත පිරිසේ නායිකාව විදේහා භික්ෂුණීන් වහන්සේයි. තෙරණියෝ වැඩමවා ගෙනා මහා බෝධියේ ශාඛාව රූපමාලා දේවිය අභිෂේක නැංවූ මහල් පිටියට උතුරින් පිහිටුවා ඊට දකුණින් චන්ද්‍රකාන්ති මෙහෙණවර ඉදි කළා. සුමංගලා ථෙරණිය මෙහෙණි සස්න යව දීපයට ගෙනගියා. දහතුන් වසරක් මෙහෙණ වරේ වැඩ විසූ කල්‍යානි නුවර ස්වර්ණ තිස්ස රජුගේ දියණි මහිලා ථෙරණිය මෙහෙණි සස්න මක්සිකා රටට ගෙන ගියා.

[වර්තමාන මාල දිවයිනේ අගනුවර මාලේ නගරයයි. එහි පැරණි නුවරක් පිළිබඳ කිසිම සලකුණක් හෝ බෞද්ධ ලාංඡනයක් ඉතිරි කර නැහැ. නමුත් ඉංග්‍රීසි

පාලන කාලයෙත් මාල දිවයිනේ බෝධින් වහන්සේලා දෙනමක් මාලදිවයින්හි තිබුණ. යන්ග් හා ක්‍රිස්ටෝපර් මෙහෙම සඳහන් කරනව:

The presence of an immence Bo Tree at Male, and another in Fua Muluku, is in importance : no traditions cling to them.

ඉතා මෑත කාලයක් දක්වාම මාලදිවයින් ප්‍රධාන වීථියක් බොයිගස් මගු නමින් හඳුන්වා තිබෙනව. බොයිගස් මගු කිව්වෙ බෝධිය මාවතයි. දිවෙහින් මගු කියන්නෙ මාවතට. බොයිගස් මගුහි තමා මහා බෝධිය තිබිල තියෙන්නෙ. එම ප්‍රදේශයේම කොටසක් අදටත් හෙන්-වේරු. දිවෙහින් වෙහෙරට වේරු කියා ව්‍යවහාර කළා. හෙන්වේරු කිව්වෙ රුවන්වැලි විහාරය යන අර්ථයනුයි. මාලදිවයින් වාසීන්ගේ ව්‍යවහාර භාෂාව සහ එදිනෙද මෙවලම් අතර පැරණි බෞද්ධ උරුමය කියාපාන යම් යම් දේ තවමත් දකින්ඩ හැකියි. ඔවුන්ගේ සංගීත භාණ්ඩ අතර බෙරය පැරණිම භාණ්ඩයයි. බෙරයට බොඩු බෙරු කියලයි දිවෙහින් කියන්නෙ]

මේය අබ්දුල්ලාගේ තවත් කථාවක්: නීල සෙනවියා සිංහල රටේ රජ්ජුරුවන්ගෙ මස්සිනා. ඔහු මහා නාවික-යෙක් වශයෙන් මලය රාජ තනතුර දැරුව. නීලගේ දුව සේලා සරණ ගියෙ සෝණ රජ්ජුරුවන්ගෙ පුතා සුජීව සමගයි. විවාහ උත්සවයට මාලොස් මඩුල්ලට පැමිණි නීල එහි ඉද්දි ඔහුගේ භාර්යාවට භයානක උණක් වැළඳී මිය ගියා. නීල ශෝකය දරා ගන්ඩ බැරිකමට දිවි නසා ගත්ත. නීලගේ භාර්යාවට හැදුන උණ මාලොස් මඩුල්ල පුරා පැතිරෙමින් දිනපතා දහය විස්ස බැගින් මියැදෙන්ඩ ගත්විට සඳමාලා දේවිය පියගු දිවයිනේ භික්ෂූන් වහන්සේලා වෙත පණිවිඩකරුවන් යැව්ව. පියගු දිවයිනේ භික්ෂූන් වහන්සේලා එකසිය එක් නමක් මාලොස් මඩුල්-ලට වැඩම කරවා සත් දිනක් මුළුල්ලේ පිරිත් කියද්දී උණ



වසංගතය දුරුවෙලා ගියා. සඳමාලා දේවිය කෝඩු දුවට අරක්ගෙන දිවයින් ආරක්ෂා කරන හූ දේවිය උදෙසා පින්කම් උළෙලක් පැවැත්තුව සිංහල රජතුමා එම උළෙල සඳහා බලි ඇදුරන්ද ගුන්දර සියයක් පුරවා සහල් රෙදිපිලි බෙහෙත් හා සුවඳ විලවුන්ද එව්ව.

සිංහලයන්ගේ ජන ප්‍රවාදයේ කළු යකා බොහොම ප්‍රසිද්ධයි. ඔහුගේ උත්පත්ති කථාව මෙහෙමයි: සොළින් සමග යුද්ධ කළ ගජබා රජ්ජුරුවන්ගේ ප්‍රධාන සෙන්පතියා නීල මහා යෝධයායි. යුද්ධය ජයගත් පසුව නීල මහිලා දිවයිනට ගිහින් එන්ඩ රජ්ජුරුවන්ගෙ අවසරය ගත්ත. මහිලා දිවයිනට ගිය නීල එහි විසූ ගැණුන්ගේ හිරකරු-වෙක් බවට පත්ව ඔවුන් අතරම මිය ගියා. ගැණුන් කෙරේ වෛරයෙන් මිය ගිය නීල යකෙක්ව උපන්න. ඒ තමයි කළු යකා. කළු යකා ගැණුන්ව ලෙඩ කරනව. මල්යහන් කවිවල කළු යක් උපත හා ක්‍රියා විස්තර කෙරෙනව.

කළු වතක් ඇඳ පෙරව කළුවන
මල් වඩම් තවයක් ගෙතා
සිතූ ලෙසින් කඩු ඉහ දරාගෙන
පොත් කඩක් ගෙන ඇවිදිතා
රති ලොබින් තරලොවේ තරලිය
ඇඟ වැසී ලෙඩ කරවතා
නිති ලෙසින් ආතුරන් රකාදෙන්
කළු යකා නම් දේවතා

සිංහල ජන ප්‍රවාදයේ කියවෙන කළු යකා සහ අබ්දුල්ලා කියන නීල සෙනවියා එක් අයෙක්. මාලදිවයිනේ ෆාෆු හා දලු අතොලු උතුරු හා දකුණු නිලන් දූ යන නමින් ද හැඳින්වෙනව. නිලන් දූ නීල සෙනවියා නිසා බැඳිච්ච නමක්ද දන්නෙ නෑ. නමුත් නිලන් දූවලට අයත් දූපත් රාශියක් ඉංග්‍රීසි පාලන කාලයේත් බෞද්ධ පුරා වස්තුවලින් පිරී තිබුණ. ඒව බොහොමයක් දූත් නැහැ. තෝර් හයර්දල් උතුරු නිලන් දූවේ අසාරි මිස්කි

දේවස්ථානය අසල කැනීමක් කළා. මෙම දේවස්ථානය ගොඩනංවා තියෙන්නෙ දේවස්ථාන හැදීම ගැන ප්‍රසිද්ධ සුල්තාන් මොහොමඩ් ඉබාන් අබ්දුල්ලා විසිනුයි. එතනට පැමිණ ඔහු පැරණි විහාරය කඩවා විහාර ගලින් දේවස්-ථානය හැදූ බවයි ජන ප්‍රවාදයේ කියවෙන්නෙ. හයර්දල්ගේ පිරිස දේවස්ථාන භූමියේ පිහිටි ආරාම සංකීර්ණය පෑදුවා. එහි පැදූ ගොඩනැගිල්ලේ පාදම දිගින් මීටර 170යි; පළලින් මීටර 150යි. විහාර බිමේ මීට සමාන ගොඩ-නැගිලි හතක් තිබුණ බව ගොඩනැගිලි පාදම් පෙන්නුම් කළා. ආරාම භූමිය ඉතාම සැලසුම් සහගතව කරන ලද්දක්. ක්‍රමානුකූලව හැදූ මාවත් ගල් පඩි ගරාදි තාප්ප දෙරටු නටබුන් මැනවින් දකින්ඩ පුළුවනි. මීට ඉහත දිනක මෙම භූමියේ වැලලී තිබී ගල් පෙට්ටි කිහිපයක් හම්බවුන බවත් ඒවායේ රත්රන් හා තඹ පත්‍ර ලේඛන මිටි රාශියක් තැන්පත් කර තිබූ බවත් ඇසින් දුටු සාක්ෂි කරුවන් ඉන්නව. වාර්තා සඳහන් කරන්නෙ මේවා මාලේ නිලධාරීන්ට භාර දුන් බවයි. නමුත් ඔවුන් භාරගත් ලේඛනවලට කුමක් කළාද යන්න අභිරහසක්. මාල දිවයිනේ ඉතිහාසය හා බෞද්ධ උරුමය ඒ ලේඛන මිටි තුළ තිබුණ බව නිසැකයි. චීනයේ ආරාමයක විසූ භික්ෂූන් වහන්සේලා පිරිසක් ලෝහ පත්‍රවල ලියා පෙට්ටිවල දමා වළලා තිබූ ධර්ම සූත්‍ර ග්‍රන්ථ සමූහයක් චීන පුරා විද්‍යාඥයින් හොයා ගත්ත. උන් වහන්සේලා එවැන්නක් කළේ ධර්මය නැතිවී ගිය කාලයක නැවත මතුකර ගැනීමටයි. මාලදිවයින් මුහුදට බිලිවීමෙන් වලක්වා ගැනීම සඳහා රහතුන් වහන්සේලාගේ උපදෙස් පවා මේ ධර්ම ග්‍රන්ථ අතර තිබුණා විය හැකියි.

සංචාරක උත්සවය සඳහා පැමිණ සිටිය දී බර්ලිනයේදී අපට හමුවූ මාලේ නිලධාරියෙක් කී පරිදි උතුරු නීලන් දූවේ ඉහත කී ගොඩනැගිලි සංකීර්ණයට ඉතා සමාන ගොඩනැගිලි සංකීර්ණයක නටබුන් බැහිර නීලන් දූවලට අයත් කුඩා හුවදූවේත් තියෙනව. ඒක මහා විහාර සංකීර්ණයක්. විහාර භූමිය අලංකාර කර තිබී ඇත්තේ



අලංකාර පවුරකින්. මේ නටබුන් අතරේ දැන් ඇත්තෙ දේවස්ථානයක්. නමුත් ඊට නුදුරින් මීටර 72ක් උස හවිත්තක් තියෙනව මේ බිමේ වැඩක යෙදී හිටි ගම්වැසියන් පිරිසකට විශාල බුදු පිළිමයක් හමුවුනා. එය දේවස්ථානයේ පාලකයින් භාරයේ ඇති.

අබ්දුල්ලා අහපු කථාවක් මෙතනදී ඉතාම වැදගත් වෙනව. මධ්‍ය මණ්ඩලයේ පැවති හතේතානය හා අස්තානය රාජ්‍යයේ ප්‍රසිද්ධ ම විද්‍යාස්ථාන දෙකයි. මේවායේ ඉගෙනුම ලබන්ඩ නොයෙකුත් දේශවලින් (නාමවලියක් අඩංගුය) මානවකයින් ආව. ගෝමි එවැන්නෙක්. ගෝමි මාගම් රටේ වෙළඳ නායක ගෝමිගේ පුතා. අංජන දූවෙ කේස ධාතු චෛත්‍ය හැදුවෙත් වැලි දූවෙ පබලු වෙහෙර හැදුවෙත් ගෝමි වෙළඳ නායකයින් විසිනුයි.

අසේතානයේ හේවිසි ගහපු සෝබිට ලන්දූ කියල රූමත් දියණියක් හිටිය. ලන්දූ තේවා නැටුම් නැටුව. ගෝමි මානවකයාගේ හිත ලන්දූ කෙරේ ඇදිල ගියෙ ඇ දුටු දවසෙදීමයි. ගෝමි දවසක් කාටත් හොරෙන් ලන්දූ හමුවෙලා තමාගෙ හිත ලන්දූට කිව්ව. "මං හේවිසිකාරයා-ගේ දුව. උඹ ලෝක ප්‍රසිද්ධ වෙළඳ නායක ගෝමිගෙ පුතා. අපි ගැලපෙන්නෙ නෑ. ඊටත් මේ රටේ ගෑණු මිනිස්සුන්ට බැඳිල ඉන්ඩ අකමැති බව උඹ දන්නවනෙ" ලන්දූ පිළිතුරු දුන්න. ලන්දූගේ හිත දිනා ගන්ඩ බැරි වූ ගෝමි දුක්වුණා. ඔහු තමාගෙ දුක කවියට නගමින් ලන්දූගෙ මිතුරි බිලිදී අත ලන්දූට කවි ලියල යැව්ව. දින ගතව ගිහින් ශිල්ප දක්වන දවස ආව. එද තමා අසේ-තානිය පිරුණ දවස. නායක ගෝමි මහ පිරිසක් සමගින් තම පුතාගෙ සමත්කම් බලන්ඩ ඇවිත් හිටිය. නමුත් අඩ ගහද්දී ගෝමිගෙ පුතා ශිල්ප දක්වන්ඩ වේදිකාවට ආවෙ නැහැ. මේ නිසා සභාවේ නොසන්සුන් තාවයක් හට-ගත්ත. ඔය අතරේදී වේදිකාවට පැමිණි ලන්දූ ගෝමි වෙනුවෙන් ඔහුගේ කාව්‍ය සංග්‍රහය ඉදිරිපත් කරන්ඩ

පණ්ඩිත සභාවේ අවසරය පැතුව. සභාව මෙහෙය වූ රේවත හාමුදුරුවෝ ලන්දූට අවසරය දුන්න. ලන්දූ එපමණක් කල් ගෝමි තමාට ලියා එවූ කවි මිහිරි ගීත බවට පත් කරමින් ගී ගායනා කරමින් නැටුව. ඒ මධුර ගායනය හා අපූර්ව නැටුම සභාව මෝහනයට පත් කළා. මෙබඳු අපූර්ව ප්‍රේම කාව්‍යයක් හා නැටුමක් තමන් කිසිදා අසා දැක නැති බව පැමිණි සිටි හැම රටකම අමුත්තො කියා හිටිය. නායක ගෝමි ලන්දූව වැළඳ ගෙන තම පුතා ගෝමිගේ භාර්යාව වෙන්නැයි ඇයගෙන් ඉල්ලා හිටිය. ලන්දූ ගෝමින් සමග මාගම් රටට ගියා. ගෝමි මාගම් රටේ රාජ සභා කවියා වුනාලු. මහිලා රාජ්‍යයේ වැසියො ගෝමි හා ලන්දූ ගැන තාමත් කියනව. රට වැසියන්ගෙ අමරණීය පෙම් ගී ලන්දූ එදා ගැයූ ගී සංග්‍රහයයි.

භූමිකා දේවියගේ කථාව කියද්දි සඳහන් වූ කෝඩූ දූව වර්තමානයේ අලිෆූ ආතොල්ලට ඉහළින් පිහිටි හුදකලා වූ කෝඩූ දූවයි. මාලේ රට වැසියන් ඉස්ලාම් ආගම වැලඳගන්නාට දිවයින් බොහොමයක වාසීන්ට රිදින් දේවීන් හා වෙනත් විශ්වාසයන් තියෙනව. විපත් අවස්ථාවක මුහුදෙන් එන දේවින්ලා ඔවුන්ව බලවා ගනී යයි හිතන රට වැසියො දුර්ලභ නැහැ. කොඩූ දූවේ ජනයාට හූ දේවිය තාම විශ්වාසයි. කෝඩූ දූවේ කාගේත් අවධානයට ලක්වෙච්ච නැති මීටර දෙකක් උස චෛත්‍යයක් තිබුණ. 1958 අවුරුද්දෙ ඒ අසලින් පුරාවස්තු රාශියක් මතුවුණා. ලේටන ගත කරල ඇත්තෙ බුද්ධ ප්‍රතිමාව, ධාතුන් වහන්සේලා සහිත කරඬුව, රිදී මංජුසාව, රන් ආභරණය සහ රෝම කාසි දෙක විතරයි. මෙයිනුත් පාලකයින්ගේ වැඩි අවධානය යොමු කළ රෝම කාසි දෙක ඉතා සුරක්ෂිතව මාලේ කෞතුකාගාරයේ තියෙනව. චෛත්‍ය වහන්සේ සලකුනක් ඉතිරි නොකර එතනින් ඉවත් කරල.

දකුණේ දූපතක හිටිය අබ්දුල්ලා වැඩිපුරම දකුණේ කථන්දර ඇහුව. නමුත් රට ගැන උනන්දුව හිටි ඔහු උතුරේ කථාන්දරත් දැන ගත්ත. ඔහු උතුරේ කාන්තාවක්ද



භාර්යාවක් වශයෙන් ගෙන ස්ත්‍රීන් දෙදෙනෙක් සමඟ හිටි බවක්ද පෙනෙනව. ඉස්සර මහිලා රාජ්‍යයේ උතුරු දූපත්වල වාසය කළේ ගොවිතැනට වැඩි උනන්දුවක් දැක්වූ යක්ෂ ගෝත්‍රිකයොයි. ඔවුන්ගේ සමහරක් කථා ලංකාවේ සිංහලයන් අතර ජනප්‍රිය කථාවලට සමානයි. ලබ්බේ තොවිලය උදහරණයක්. එදා රෑ වැහි වැහැල කුණාටු හමල දූපත වතුරෙන් යටවෙන්ඩ එද්දි ගමරාළ ලබු දෝනියක් ගෙනත් මුලු තොවිලයම ඒකට ඇතුල් කරල සප්පායමුත් දමල තමාත් ඒකට රිංගල දෙර වසා ගත්ත. ගංවතුරට ගහගෙන ගිය දෝනිය මුදට ගියා. ඒක විශාල මාළුවෙක් ගිල්ල. ඇවුලුමකට අහුවුන දෝනිය ගිල්ල මාළුවා ඇදගෙන ආවෙ කාල්හු (කාක්) දූපතටයි. මෝරගෙ බඩ පලද්දි දෝනිය මතුවුණා. දෝනියේ පියන අරිද්දි ඩෙනෝ කියාගෙන තොවිල්-කාරයො එළියට ආව.

මේකත් උතුරේ කථාවක්. මාරන්ගා දූපතේ හිටිය හඳුනි බොහොම ප්‍රසිද්ධ අක්ෂි වෛද්‍යවරියක්. හඳුනි සොයාගෙන නොයෙකුත් රටවලින් නාවිකයන් ආව. හඳුනිගෙ දූව පුසී බාල කාලයේ පටන්ම නාවිකයන්ගේ ඇසුරට වැටිම නිසා ඈ අභිසාරිකාවක් වුණා. තොටුමුණු කීපයකම නැටුම් හල් පවත්වා ගෙන යාමටත් සිය ගණනක් දැසි දස්සන් තබා ගැනීමටත් තරම් පුසී පොහොසත් වුණා. පුසී දවසක් මාගල් නැටුම් හලේ ඉඳගත කවුළුවකින් එළිය බලාගෙන ඉද්දි සන්සුන් ගමනින් වඩිනා මෙහෙණියක් දැකල සේවිකාවක් යවා ඈ තම නැටුම් හලට කැඳවා ගත්ත. මෙසේ කැඳවා ගත්තේ මුලු මහිලා දීපයටම පහනක් වූ උත්තමා ථෙරණියයි. පුසී ථෙරණියට දනය පිළිගන්නවා ජීවිතයේ සතුට පිළිබඳව ථෙරණිය සමග සාකච්ඡා කරද්දි ''ජීවිතයේ සතුට කියන්නෙ සිත්දු කිමවත් නැටීමවත් ධනය හා දැසි දස්සන් රැස්කිරීමවත් නෙමෙ, හිත ශූන්‍යත්වයට පත්කර ගැනීමයි; ප්‍රීතිමත් සිත කියන්නෙ නිශ්චල සිතයි'' ථෙරණිය කිව්ව.

මෙහෙණි ශාසනයට ඇතුල්වීමට කැමැත්ත පළ කළ පුසී තම සියළු වස්තුව බෙද ගන්නැයි සේවක සේවිකාවන්ට නියම කරල උත්තමා ථෙරණිය සමහ මගට බැස්ස. පිය සටහන් ශබ්දය ගැන සිතමින් සිත එකග කරගත් ඇ අතර මගදීම රහත් ඵලය ලැබුවා. පුසී ගැන ඇසූ සේවක සේවිකාවෝ හඩා වැලපුණා. ඔවුන් තමා පුසී චෛත්‍ය ගොඩ නැංවූවෙ.

පාලන පහසුව උදෙසා මාලදිවයිනේ දකුණේ දූපත් ගාfපු අලිfපු ගාfපු දලු fපුඅා මුලකු හා සීනු යන නම්වලින් මඩුලු හතරකට කොටස් කර තියෙනව. මේ කොටස් හතරට පුරාණයේ නාග මණ්ඩලය යන නම ව්‍යවහාර කළා. නාග මණ්ඩලම ඉතාම පොහොසත් සහ ප්‍රඥාවන්ත ජනයා හිටි ප්‍රදේශයක්. එම නිසා නාග මණ්ඩලය ඉතාම අලංකාර ඒවාගේම ප්‍රසිද්ධ වෙහෙර විහාර රාශියකින් බැබළුනා. බර්බර හමුදව මුලින්ම පැන්නෙ නාග මණ්ඩලයටයි. ගාfපු දලු මඩුල්ලෙ වා දූවෙ මලහන්දු දේවස්ථානය ගොඩනැංවූයේ එම බර්බර සේනාව මෙහෙය වූ බර්කන් විසිනුයි. විහාරයක් බිඳ එහි ගොඩනැගිලි උපකරණ ගෙන විහාරය මතමයි දේවස්ථානය හදල තියෙන්නෙ. අබ්දුල්ලා කියන විදිහට මලහන්දු දේවස්ථා-නය හැදුවේ දෙමටමල් විහාරය මතයි. දෙමටමල් විහාරයේ ආනන්ද ථෙරුන් වහන්සේගේ ධාතු නිදන්කර තැනූ චෛත්‍ය පිරිවැරූ චෛත්‍ය අටක් සහ අභිෂේක පොකුණ තිබුණ. මලහන්දු දේවස්ථාන භූමි ප්‍රදේශයේ චෛත්‍ය දෙකක් ඉතිරි වී තියෙනව. ඒවා බොදු හවිත්ත හා විදමග් හවිත්ත යන නම්වලින් හඳුන්වනව. අනුරාධපුර සමයේ පොකුණකට ඉතා සමාන අභිෂේක පොකුණක් තාම දකින්ඩ පුළුවනි.

ගාfපු අලිfපු සහ ගාfපු දලු උතුරු සහ දකුණු හුවදූ ලෙසද නම් කෙරෙනව. උතුරු හුවදූ මඩුල්ලෙ අගනුවර විලිගිලි. විලිගිලිහි තිබුණ විශාල චෛත්‍ය පිළිබඳව වාර්තා සටහන් තියෙනව. එය දැන් නැහැ; ඉවත් කරල.



චෛත්‍යට ගිය මාර්ග නාමය (හවිත්ත මග) පමණක් අදටත් භාවිතා කරනව. දේව දූ උතුරු හුවදූ මධ්‍යයේ පිහිටි දූපතක්. අබ්දුල්ලා දේවපුරය සම්බන්ධ කථාවක් ද කියනව. දේව දූවේ තවමත් විනාශ නොකළ හවිත්ත හතරක්ම තියෙනව. හකුරු මිස්කි දේවස්ථානය ගොඩ-නංවා ඇත්තෙ දේව දූවෙ විහාරය උඩයි.

උතුරු දකුණු විදිහට හුවදූ වර්ග කරන්ඩ ඉස්සර දූපත් දෙසිය අනූ දෙකකින් සමන්විත හුවදූ එකම දූපත් මඩුල්ලක්. මඩුල්ලේ අගනුවර තින දූ දූන් දකුණු අගනුවර දකුණු හුවදූවලට පමණයි. තින දූ තමා මහිලා දිවයින් රාජ්‍ය බැබළු පියඟු දිවයින. බුදු හාමුදුරුවො වැඩියේත් ප්‍රඥා පාරමිතා සූත්‍රය වදළේත් සූත්‍රය ග්‍රන්ථාරූඪ කළේත් නාගර්ජුනී රහතන් වහන්සේ වැඩියේත් පියඟු දිවයිනේයි.

ලංකා ඉතිහාසයෙත් පියඟු දිවයින පියඟු විහාරය සහ එහි භික්ෂූන් වහන්සේලා ගැන ඉතා වැදගත් ඓතිහාසික අවස්ථාවල සඳහන් වෙනව. ඒ පියඟු දිවයින යාපා පටුනට අයිති පුංකුඩු දිවයිනයි. පුංකුඩු දිවයිනේ බෞද්ධ විහාරයක නටබුන් ලංකා පුරා විද්‍යා වාර්තාවක දැක්වෙනව.

අනුරාධපුර රාජධානි සමයේ ගමක් ගොඩනැංවූවේ වැවක් බැඳලයි. හැම ගමකටම නැතිනම් ගම් ගොඩකටම පන්සලක් තිබුණ. මේ විදිහට තමා මහිලා දිවයිනේ ගම් හැදුවෙත්. මහිලා දිවයින් වාසීන් විල් හා පොකුණු බැන්ද. හැම ගමක්ම පන්සලක් හදගෙන හිටිය. එමනිසා මහිලා දිවයින් කිව්වෙ පන්සල් රාජ්‍යයකටයි. දූපතක් පාසා අහසට නැගුණු මුතු මැණික්වලින් අලංකාර කළ කොත් කැරලි සහිත වෙහෙර දාගැබ් මුහුදු ගමනේ යෙදෙන්නන්ට හරිම ආනන්ද ජනක දර්ශනයක් වුණා. ඒ චෛත්‍ය අතරින් කීපයක් අහසට නාගිත කුඩා කඳුගැට ලෙසින් දූපත් කීපයක පමණක් අදටත් දකින්ඩ පුළුවනි.

සංචාරක කර්මාන්තයට උවමනා නිසා ඉතිරි චෛත්‍ය ඕපය ඉවත් කිරීම අත්හිටුවා තියෙනව.

ආසියාවෙ රටවල් ගණනාවක්ම තම උරුමය හා සම්පත් බටහිරට විකුණාගෙන කාල ජීවත් වෙන්ඩ හදනව. උරුමය විකුණා කෑම ඔවුන්ගේ ආර්ථික දර්ශනය වෙලා.

ආසියාවේ පාලකයින් ස්වභාවික සම්පත් හැරුන විට තමන්ට විකුණාගෙන කෑමට හොඳම භාණ්ඩ වශයෙන් සලකන්නෙ සංස්කෘතික උරුමයයි. ආසියාවෙ හැම රටකටම බෞද්ධ උරුමයක් තිබුණ. උරුමය හෝ නටබුන් ඉතිරිවී තියෙන්නෙ ඉස්ලාම්, කතෝලික හා කොමියුනිස්ට් ආක්‍රමණයේ බරපතලකම අනුවයි. පිලිපීනය වැනි රටවල බෞද්ධ උරුමය කියා මොකවත්ම ඉතුරු කරල නැහැ. නමුත් ඉස්ලාම් රටවල බෞද්ධ උරුමය වශයෙන් මොනවා හෝ තියෙනව. ඒ සේරම ඉතිරි කරගෙන ඉන්නෙ සංචාරක කර්මාන්තයේ නාමයෙන් විකුණාගෙන කෑමටයි. ඉන්දුනීසියාව සංචාරක ව්‍යාපාරය කී වහා බොරෝබදූර් කියනව. බමියාන් (ලෝකයේ විශාලම හිටි පිළිමය) ඇෆ්ගානයේ පාලකයින්ගෙ සංචාරක කේන්ද්‍රයයි. පකිස්ථානය සංචාරක පත්‍රිකාවක් ගානෙ පෙන්වන්නෙ ගාන්ධාර ප්‍රතිමා; නැතිනම් දුෂ්කර ක්‍රියාව දක්වෙන සුප්‍රසිද්ධ බුද්ධ ප්‍රතිමාව. චීනය, වියට්නාමය ආදී රටවල ආණ්ඩු කොමියුනිස්ට් ආණ්ඩු විසින් පාළු කළ පන්සල් සහ ආරාම සංචාරක ගුබ්බෑයම් කරගෙන යනව.

බෞද්ධ ශාසනය පවතින රටවල් කතෝලික ආක්‍රමණයට ගොදුරු වෙලා. තායිලන්තය හා ලංකාව පාලනය වෙන්නෙ අද්‍යශ්‍යමාන වතිකානු අත්වලින්. බුරුමයේ ආණ්ඩුව පෙරලා බටහිරින් බෞතිස්ම වූ කාන්තාවකට රට දෙන්න සටනක් ගෙනියනව. ලංකාවේ හා තායිලන්තයේ පාලකයො සංචාරක ව්‍යාපාරයට මුළා



වෙලා. ලංකාවේ සංස්කෘතික ත්‍රිකෝණය ත්‍රස්තවාදී වැඩ පිළිවෙලක්. පන්සල් හා පූජනීය ස්ථාන සංචාරකයින්ට පාවා දීම ත්‍රිකෝණයේ එක ප්‍රධාන පරමාර්ථයක්. එම ත්‍රස්තවාදී ව්‍යාපාරය පටන් ගත් එ. ජා. පක්ෂ ආණ්ඩුව පන්සල් හා පූජනීය ස්ථාන සංචාරක ව්‍යාපාරයට පවරා දීමට රටේ නීති වෙනස් කරන්ඩ පවා උත්සාහ ගත්ත.

හයියෙන් වැහි දෙක තුනක් වැස්ස හැටියෙ බටහිර යුරෝපා රටවල් බොහොමයකට ගංවතුර එනව. ලංකාවට ගංවතුර කියල විපත්තියක් දුන්නෙ පරිසරය විනාශ කළ ඉංග්‍රීසින් විසිනුයි. නමුත් ගංවතුර ගැලීම් වලක්වන්ඩ ලංකාවෙ පාලකයින් උපදෙස් අහන්නෙ යුරෝපයෙන්. යුරෝපය කියන්නෙ ජලය, වාතය, පස ආදී සියලුම ස්වභාවික වස්තූන් විනාශ කරගත්ත භූමියක්. එතනින් අදටත් ලංකාව ඉන්දියාව මාල දිවයින් ඇතුලු ලෝකය විනාශ කරනව. නමුත් ලංකාව බඳු රටවල් පරිසර විනාශයන් වලක්වන්ඩ යුරෝපයෙන් උපදෙස් අහනව. යුද්ධය හා මානව හිමිකම් ගැන කිව යුත්තේ ද මේ ටිකමයි. වර්ණය, ලිංගය, රට, ආගම ආදී කරුණු පදනම් කරල යුරෝපයේ මරා ඇති මනුෂ්‍ය ප්‍රමාණය කොතරම්දැයි ගණින්ට බැහැ. අදටත් මිනුෂ්‍යයන් පිළිබඳ යුරෝපීය චින්තනය යුරෝපයේ ජීවත්වන ඔළුගෙඩි ඇති සහ බැට කෑ විදේශිකයින් දන්නව. මෙතනින් තමා ලෝකයම විනාශ කරන අවි ආයුධ හා රසායනික ද්‍රව්‍යවලින් වැඩිම ප්‍රමාණය හදන්නෙ. නමුත් ඔවුන් ලංකාව ආදී රටවලට මානව හිමිකම් උගන්වනව. ලංකාවේ පාලකයින් රටේ ප්‍රශ්න විසඳන්න හදන්නෙත් සාමය ගේන්ඩ හදන්නෙත් මෙතනින් කියන විදිහටයි.

මුහුදෙන් බේරෙන්නෙ කොහොමදැයි කියල මාල දිවයිනට උපදෙස් දෙන්ඩ ලංකාවට බැහැ. මාලදිවයින් අත්කර ගන්නා ඉරණම ලංකාවටත් අත්වෙනව. අඥාවන්ත දේශපාලකයින් හා බැල ආචාරීන් රට මුහුදේ ගිල්වන්ඩ ඇදගෙන යනව.

මාලදිවයින් හා මීනිකොයි දිවයින්වලත් ලංකාවේත් ඉදල තියෙන්නෙ එකම නෑදෑ කණ්ඩායමක්. ඔවුන් සිංහලයො. මාලදිවයින් හා මිනිකොයි වාසීන් බුද්ධාගමින් ඉවත්කළ පසුව ඔවුන්ගේ ජාතික අනන්‍යතාවය නැතිව ගියා. සිංහල ජාතියේ ජීවිතය බුද්ධාගම සමග බැඳී ඇති බව මේ සිද්ධියෙන් ඔප්පු වෙනව. බුද්ධාගමින් ඉවත් කළ සිංහලයා ලාංකිකයෙක් මිස සිංහලයෙක් නොවේ.

නිමි.

## කර්තෘගේ වෙනත් පොත්

1. ලංකාවේ වැව්
2. ඉඩම් හා පරවේණි
3. දහස් පෙතියා (නවකතාවකි)
4. මීලේච්ඡයා වනචාරියා නොහොත් තිරිසන් ලාංකිකයා
5. අභිගුණ්ඨිකයෝ අපේ නෑදෑයෝ
6. ගුරු පරපුරෙහි වීරයෝ
7. සිහල මග
8. මහ විජයබා අතලඟ
9. කොළඹට කිරි ගමට කැකිරි
10. නෝබල් තෑග්ග
11. කරාව කථාව
12. ගොවිගම, බත්ගම නැකති යකුන්නේ
13. ගාඩි වංශය (එන්.ටී. කරුණාතිලක සමග) - කොලට් සේනානායක නමිනි
14. අපරාජිතා
15. කමත් යන්ත්‍රය (වල්ලි නමිනි)
16. සැඟවුන සුවඳ